සබරගමුව පළාත් සභාව
சபரகமுவ மாகாண சபை
SABARAGAMUWA PROVINCIAL COUNCIL

*2016 නොවැම්බර් මස 21 වෙනි සඳුදා දින*
*2016 நவம்பர் மாதம் 21 ஆம் திகதி திங்கட்கிழமை* ***Monday 21 st November 2016***

ගරු සභාපති කංචන ජයරත්න මැතිතුමාගේ මූලාසනාරූඪත්වයෙන් පෙ.ව.10.00 ට සභාව රැස්විය.

கௌரவ தவிசாளர் - கஞ்சன ஜயரத்ன அவர்களின் தலைமை வகித்தார்கள் மு.ப. 10.00 மணிக்கு சபைக் கூடியது.

The Council met at 10.00 a.m Hon.Chairman Kanchana Jayarathna preside the Chair

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
-----------------------------------------------------

සියළුදෙනාටම සුභ උදෑසනක් වේවා ! ගරු අමාත්‍යතුමන්ලා, ඒ වගේම නියෝජ්‍ය සභාපතිතුමා, සභානායකතුමා, ඒ වගේම විපක්ෂනායකතුමා ප්‍රමුඛ ගරු මන්ත්‍රීතුමන්ලා සියළුදෙනාගෙන් සහ ගරු මන්ත්‍රීතුමියගෙන් අවසරයි. අද දිනට න්‍යාය පත්‍රානුකූලව සභාවේ වැඩ කටයුතු ආරම්භ කිරීම සඳහා පළමුවෙන් තිබෙන්නේ,

**අභිනව මන්ත්‍රීවරුන්ගේ ප්‍රතිඥා හෝ දිවුරුම් දීම : නැත**

**ගරු ආණ්ඩුකාරතුමාගෙන් ලැබෙන සංදේශ:**

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
-----------------------------------------------------

2016 ක් වූ 11 වෙනි මස 08 වෙනි දින සභා රැස්වීමේ දී සාකච්ඡාවට භාජනය වූ කරුණු සම්බන්ධයෙන් ගරු ආණ්ඩුකාරතුමා විසින් එවා තිබෙන නිවේදනය සභාවට ඉදිරිපත් කරනවා.

**ආණ්ඩුකාරවර විසින් නිකුත් කරනු ලබන නිවේදනයයි.**

මෙම නිවේදනය නිකුත් කරනු ලබනුයේ 2016 වර්ෂයේ නොවැම්බර් මස 08 වෙනි දින පැවති සබරගමුව පළාත් සභා රැස්වීමේ සාකච්ඡාවට බඳුන් වූ කරුණක් සම්බන්ධයෙනි.

2016.11.09 වැනි බදාදා දින ලංකාදීප පුවත්පතෙහි ‘‘අර්ජුන් මහේන්ද්‍රන් සබරගමුව පළාත් සභාව ගාලගෝට්ටියක් කරයි‘‘ යන මැයෙන් පළවූ වාර්තාවේ සඳහන් කර ඇති පරිදි පසුගිය සභාවාරයේ දී මගේ ක්‍රියාකලාපය විවේචනයට ලක්කර ඇත.

මෙලෙස මගේ ක්‍රියා කලාපය විවේචනයට බඳුන් කිරීම උදෙසා නිදර්ශනයක් වශයෙන් ඉදිරිපත් කිරීමට යෙදුනු කාරණයෙහි අන්තර්ගතය විමසා බැලීමේ දී මා විසින් ගනු ලැබූ තීන්දු තීරණයන් වශයෙන් ඉදිරිපත් කර ඇති

කරුණුවල නිරවද්‍යතාවය සම්බන්ධයෙන් යම් ගැටළුකාරී තත්ත්වයක් පවත්නා බැවින් මවිසින් එය නිවැරදි කළ යුතුව ඇත.

ර/ඇරුපොල මහින්ද මහා විද්‍යාලයේ විදුහල්පතිවරයා වන ආර්.ඒ.ලක්ෂ්මන් මහතා සම්බන්ධයෙන් විනය කරුණකට අදාළව අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් ලබාදී ඇති ස්ථානමාරු නියෝගයක් මවිසින් අත්හිටවනු ලැබ ඇති බවත්, එකී විදුහල්පතිවරයා නැවත එම පාසලට පත්කිරීමට මවිසින් කටයුතු කර ඇති බවටත් මෙම සභාව වෙත කරුණු ඉදිරිපත් කර ඇත.

අදාළ විදුහලේ විදුහල්පතිවරයා විසින් මෙම හදිසි ස්ථානමාරුවීම හේතුවෙන් ඔහු අපහසුතා රසකට මුහුණපා ඇති බවට මා වෙත අභියාචනා කිරීමට යෙදුන අතර, එය සළකා බලා එම ස්ථාන මාරුව 2017.01.01 දින දක්වා අත්හිටුවන ලෙස මවිසින් 2016.09.21 දින නියෝග කරනු ලැබ ඇත. නමුත් කරුණු සම්බන්ධයෙන් දැනුවත් වීමෙන් පසුව 2016.10.11 වැනි දින එම නියෝගය “2016.11.15 වන දින සිට ස්ථාන මාරුකිරිම“ යනුවෙන් මවිසින් සංශෝධනය කරනු ලැබ ඇති අතර, අධ්‍යාපන ලේකම් විසින් ද එම නියෝගය පිළිපැදීමට කටයුතු කර ඇත. මෙම කරුණට අදාළව සත්‍ය තොරතුරු එපරිදි වන අතර, පසුගිය සභාවාරයේ දී ඉදිරිපත් කරනු ලැබ ඇති කරුණු මේ අනුව නිවැරදි කර ගනු ඇතැයි මා අපේක්ෂා කරමි.

එසේම මහජන නියෝජිතයින් හා ඉහළ නිළධාරීන් විසින් ගනු ලබන්නා වූ පරිපාලන තීන්දුවලට පටහැනිව මවිසින් ක්‍රියාකරනු ලබන බවට ඉදිරිපත් වූ මතයට වැඩිමනත් වශයෙන් මෙලෙස සඳහන් කරනු කැමැත්තෙමි. යම් අවස්ථාවල දී මවිසින් එලෙස ක්‍රියාකරනු ලැබ ඇත්නම් එසේ ක්‍රියාකර ඇත්තේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අදාළ දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ සහ 1987 අංක 42 දරණ පළාත් සභා පනත )32 (1), 33 (8), වගන්ති), 1989 අංක 12 දරණ පළාත් සභා (අනුෂංගික විධිවිධාන) පනත, 1990 අංක 28 දරණ පළාත් සභා (සංශෝධන) පනත යටතේ ආණ්ඩුකාරවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව විනා මගේ හුදු අභිමතය පරිදි පමණක් නොවන බවත්, එලෙස ගනු ලැබූ සියළු තීන්දු තීරණ ගනු ලැබුවේ ඔබ නියෝජනය කරනු ලබන ජනතාවගේ හඬට කන්දී මිස මාගේ පෞද්ගලික අභිලාෂයන් මුදුන්පත් කර ගැනීමේ පටු චේතනාවෙන් නොවන බවත් මෙහිලා අවධාරණය කරනු කැමැත්තෙමි.

එපමණකදු නොව ඉහළ නිළධාරීන් විසින් ගනු ලබන තීන්දු තීරණ වෙනස් කිරීම සම්බන්ධයෙන් මහජන නියෝජිතයින් විසින්ම ඉල්ලීම් කරනු ලබන අවස්ථා විරල නොවන බව ද මෙහිලා සඳහන් කරනු කැමැත්තෙමි.

කෙසේ වුවද ආණ්ඩුකාර ධූරය හොබවමින් ඔබ පළාතේ ජනතාවට යම් සේවයක් ම විසින් ඉටු කරන්නේ ද එය හුදෙක් මාගේ හෘද සාක්ෂියට එකඟව ජනතා හිතසුව පිණිස අරමුණු කොටගෙන ඉටුකරනු ලබන සේවයක් පමණක් බවත් මාගේ තනතුර උපයෝගී කොටගෙන මාගේ පෞද්ගලික අභිප්‍රායන් මුදුන්පත් කර ගැනීම උදෙසා වන කිසිදු කාර්යයක් මවිසින් සිදුකර නොමැති බවත් මෙහිලා

වගකීමෙන් යුතුව ප්‍රකාශ කර සිටිනු කැමැත්තෙමි.

එසේම 1987 අංක 42 දරණ පළාත් සභා පනතේ 18 වන වගන්තිය ප්‍රකාරව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ (4) වන ඡේදයට යටත්ව, ජනාධිපතිවරයාගේ හෝ ආණ්ඩුකාරවරයාගේ හෝ අධිකරණ නිළධාරියෙකුගේ හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුගේ හෝ පැවැත්ම පිළිබඳව පළාත් සභාවක දී කිසිදු සාකච්ඡාවක් නොවිය යුතු ලෙසට සඳහන්ව ඇති බව ද ඔබගේ අවධානය යොමු කරනු පිණිස මෙහිලා සඳහන් කරනු කැමැත්තෙමි.

මාෂල් පෙරේරා,

ආණ්ඩුකාරවර,

සබරගමුව පළාත.

2016 ක් වූ නොවැම්බර් මස 10 වන දින.

එතුමාගේ ප්‍රකාශය සභාවට මම ඉදිරිපත් කළේ. ඒ පිළිබඳව සභාවේ තමුන්නාන්සේලා සියළුදෙනාම දැනුවත් වෙන්න ඇතැයි කියලා මම විශ්වාස කරනවා.

**ගරු සභාපතිතුමාගේ නිවේදන :**

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*

---

මන්ත්‍රීතුමන්ලා විසින් සභා රැස්වීම අතරතුර දුරකථන භාවිතය සම්බන්ධයෙන්.

මෙම කරුණු අඩංගු ලිපිය මේ වනවිට ගරු මන්ත්‍රීතුමන්ලා වෙත මේ වෙනකොට ලබාදී තිබෙනවා. උක්ත කරුණ සම්බන්ධයෙන් සාකච්ඡා කළ 2016.09.13 දින පැවති සභා කටයුතු සහ පහසුකම් පිළිබඳ කාරක සභාව, සභා රැස්වීම අතරතුර දුරකථන භාවිතා කිරීම මඟින් සභා රීතීන් කඩවීම , රැස්වීමේ ගරුත්වයට හානිකරවීම සහ සභා කටයුතුවලට බාධාවීම සිදුවන බැවින්, මෙතෙක් කලක් ආරක්ෂා කරන ලද සදාචාරාත්මක සභා රීතීන්ට ගරු කරමින් ඒවා ආරක්ෂා කිරීමට කටයුතු කරන ලෙස ගරු ආණ්ඩුපක්ෂ සංවිධායකතුමා සහ ගරු විපක්ෂ සංවිධායකතුමා මඟින් දැනුවත් කිරීමට තීරණය කරන ලදී.

එසේම ඒ පිළිබඳව තව පෞද්ගලික අවධානය යොමුකර කටයුතු කරන ලෙස සියළුම ගරු මන්ත්‍රීවරුන් වෙත ලිඛිතව දන්වා යවන ලෙස 2016.09.27 වන දින පැවති සභා කටයුතු සහ පහසුකම් පිළිබඳ කාරක සභාවේ දී මා විසින් මා වෙත උපදෙස් දෙන ලදී. එබැවින් උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබතුමාගේ/ ඔබතුමියගේ කාරුණික

අවධානය යොමුකර කටයුතු කරන මෙන් කාරුණිකව ඉල්ලමි.

ඒ එක නිවේදනයක්. තව නිවේදනයක් තියනවා සභාපතිවරයාගේ නිවේදන යටතේ. කාරක සභා සාමාජික ගරු මන්ත්‍රීවරුන් විසින් කාරක සභා රැස්වීම් සඳහා සහභාගී නොවීම සම්බන්ධයෙන් මෙම කරුණු අඩංගු ලිපිය සියළුම මන්ත්‍රීතුමන්ලා වෙත ලබාදී තිබෙනවා.

කාරක සභා සාමාජික ගරු මන්ත්‍රීවරුන් විසින් කාරක සභා රැස්වීම්

සඳහා සහභාගී නොවීම පිළිබඳව ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල මැතිතුමා විසින් 2016.10.11 වන දින සභා රැස්වීමේ දී කරන ලද ප්‍රකාශය පිළිබඳව දැඩිව අවධානය යොමුකළ එදින පැවති සභා කටයුතු සහ පහසුකම් පිළිබඳ කාරක සභාව, කාරක සභා රැස්වීම් සඳහා ගරු මන්ත්‍රීවරුන් සහභාගී නොවීම හේතුවෙන් කාරක සභා පවත්වාගෙන යාම සඳහා එහි සභාපතිවරුන්ට දැඩි පරිශ්‍රමයක් දැරිය යුතු බවත්, සහ සමහර අවස්ථාවන්හිදී නිළධාරීන් සහ මහජනතාව ඉදිරියේ කාරක සභාව දැඩි අපහසුතාවයකට ලක්වීමට හේතුවක් වන බවත්, එබැවින් කාරක සභා රැස්වීම් සඳහා හැකි සෑමවිටම අනිවාර්යයෙන්ම සහභාගී වන ලෙස ගරු මන්ත්‍රීවරුන් වෙත ලිඛිතව දන්වා යැවීමටත් තීරණය කරන ලදී.

එසේම ඒ පිළිබඳව තම පෞද්ගලික අවධානය යොමුකර

කටයුතු කරන ලෙස සියළුම ගරු මන්ත්‍රීවරුන් වෙත ලිඛිතව දන්වා යවන ලෙස 2016.10.11වන දින පැවති සභා කටයුතු සහ පහසුකම් පිළිබඳ කාරක සභාවේ දී තීන්දු කරන ලදී. එබැවින් ඒ කාරණාව පිළිබඳවත් විශේෂයෙන් දැඩි අවධානයට ලක් කරන ලෙස ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා. මේ වෙනකොට අපි මෙතෙක් මේ වර්ෂය තුළ මේ කාරක සභා සඳහා සහභාගී වූ කාරක සභා නියෝජිතවරුන්ගේ නාම ලේඛණයක් අපි වෙනම සකස් කරලා ගරු සභාවට වාර්තා කිරීමට අපි කටයුතු කරනවා. කාරක සභාවෙන් කාරක සභාවට පත් කරලා තියන මන්ත්‍රීවරු කවුද ? ඒ අය සහභාගී වෙච්ච වාර ගණන කීයද කියන එක අපි සභාගත කිරීම සඳහා ඉදිරියේ දී කටයුතු සූදානම් කරලා තියනවා කියන එකත් අපි දැනුම් දෙනවා.

**නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා :**

ගරු මන්ත්‍රී සමිත ආටිගල මැතිතුමා.
ගරු මන්ත්‍රී ආනන්ද මිල්ලන්ගොඩ මැතිතුමා
ගරු මන්ත්‍රී චමිල දිසානායක මැතිතුමා.
ගරු මන්ත්‍රී ඉඳුනිල් ගුණසේන මැතිතුමා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

-----------------------------------------------------

ඒ නම් සඳහන් කරන ලද සියළුම ගරු මන්ත්‍රීතුමන්ලා සඳහා අද දින නිවාඩු අනුමත වෙනවා.

**ලිපි ලේඛණ පිළිගැන්වීම :**

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

-----------------------------------------------------

සභාව කල් තබන අවස්ථාවේ යෝජනා ඉදිරිපත් කිරීම යටතේ ගරු ආරියවංශ බාසූරිය මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ලිපියට පිළිතුරු ලැබී

තිබෙනවා. ඒ ලිපිය ඔබතුමාට ලැබෙන්න සළස්වනවා.

**කාරක සභා වාර්තා පිළිගැන්වීම : නැත**

**පෙත්සම් : නැත**

**ප්‍රශ්න : නැත**

**අමාත්‍යාංශය නිවේදන හෝ අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ : නැත**

**පෞද්ගලික ප්‍රකාශ කිරීම් :**

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*

---

මේ යටතේ ගරු නමින්ද අනුරප්‍රිය මන්ත්‍රීතුමාට අවස්ථාව.

*ගරු මන්ත්‍රී නමින්ද අනුරප්‍රිය*
*கௌரவ நமிந்த அனுரபிரிய*
*Hon.Member Naminda Anurapriya*

---

ගරු සභාපතිතුමනි, පෞද්ගලික ප්‍රකාශ කිරීම් යටතේ මෙම අවස්ථාව ලබාදීම සම්බන්ධයෙන් සභාපතිතුමාට ස්තුතිවන්ත වෙනවා. ගරු සභාපතිතුමනි, අපේ මුළු පළාතේම පොදු ප්‍රවාහන සේවාව පිළිබඳව මට පෞද්ගලිකව සභාව වෙත දැනුවත් කිරීමක් මේ අවස්ථාවේ කළයුතුව තිබෙනවා ගරු සභාපතිතුමනි. පොදු ප්‍රවාහන සේවය කියන්නේ ලංගම සේවාව විශේෂයෙන්ම රත්නපුර දිස්ත්‍රික්කය වෙනුවෙන් අවිස්සාවේල්ල ඩිපෝව , කලවාන ඩිපෝව, ගොඩකවෙල, බලන්ගොඩ සහ රත්නපුර යන ගමනා ගමන මණ්ඩලයේ ඩිපෝ කීපයක් තිබෙනවා. මේ ඩිපෝවල ගරු සභාපතිතුමනි, දැනට තියන තත්ත්වය අනුව අපේ රාත්‍රී කාලයේ ප්‍රවාහන සේවාව සඳහා ලංගම බස් රථ තමයි රාත්‍රී 8.00, 9.00, 10.00 වෙනකොට ඈත දුර බැහැර

ප්‍රදේශවලට යන්නට පොදු ප්‍රවාහන සේවය ලාභ ලැබුවේ නැති වුනත් සේවාවක් හැටියට කරන පොදු ප්‍රවාහන සේවය. මේ වෙනකොට ගරු සභාපතිතුමනි, ලංගමේ සේවකයින් ලංගම ප්‍රතිව්‍යුහගතකරණය යටතේ සේවකයින්ට වන්දි ක්‍රමයක් ලබාදීලා ඉවත් කරමින් පවතිනවා. මේකත් එක්ක ගරු සභාපතිතුමනි, කලවාන බස් ඩිපෝව සේවකයින් මේ වෙනකොට ඉවත් කරලා තිබෙනවා. ඒ වගේම කලවාන ඩිපෝව රත්නපුරට හෝ බලන්ගොඩට ආදේශ කරන්නට කටයුතු කරගෙන යනවා. ඒ කියන්නේ සමස්තයක් හැටියට ලංකාව පුරාම ලංගම බස් සමාගම් තිබෙන ඒවා ඒ ප්‍රමාණය අඩු කරන්නට වර්තමාන රජය කටයුතු කරගෙන යන බව තමයි මට ලංගමත් එක්ක කථා කළාම දැන ගන්න ලැබිලා තියෙන්නේ. උදාහරණයක් හැටියට ලංකාවේම ඩිපෝ 150 ක් තියනවා නම් 50 ක් අයින් කරලා 100 ක් තියනවා. කලවාන ඩිපෝව සාමාන්‍යයෙන් රාත්‍රී බස් සේවාව බස් නැවැත්වීමේ ස්ථානයක් පමණක් බවට පත් කරන්නට මේ වෙනකොට සැළසුම් සූදානම් වෙලා තියන බව මට තොරතුරු ලැබිලා තියනවා.

ඒ අනුව කලවාන ඩිපෝව රත්නපුරට ආදේශ කරලා එහෙම නැත්නම්

කලවාන ඩිපෝව බලන්ගොඩට ආදේශ කරලා එතකොට කලවාන ප්‍රදේශයේ බස් ධාවනය කරන ඈත දුර බැහැර ප්‍රදේශවල රාත්‍රී බස් සේවාවන් යවන්නට නිළධාරින් නොමැතිකම නිසා මේ පොදු ප්‍රවාහන සේවය සම්පූර්ණයෙන්ම අඩාල වීමේ තත්ත්වයකට මේ වෙනකොට

භාජනය වී තිබෙන බව සියළු තොරතුරු අපි සතුව තිබෙනවා. ඉතින් ඒ නිසා ගරු සභාපතිතුමනි, පොදු මහජන සේවාව වෙනුවෙන් අපේ එකම සේවාව තමයි සීසන් එකක් අරගෙන දරුවෙකුට පාසලට යන්නට, ඒ වගේම රැකියාවකට ගිහිල්ලා එන කෙනාට රෑ බෝ වෙලා කොළඹ දිහාවේ ඉඳලා ආපසු තමන්ගේ නිවසට රාත්‍රියේ දී එන්නට තිබෙන මේ අපේ ලංගම බස් ප්‍රවාහන සේවය මෙලෙස කප්පාදු වෙනවා නම් මේක අපේ සාමාන්‍ය ජනතාවට වදින මහා මරු පහරක් ගරු සභාපතිතුමනි. ඒ නිසා මම ගෞරවයෙන්

ඉල්ලා සිටිනවා ඒ අදාළ බලධාරීන් දැනුවත් කරලා ලංගම මෙසේ විනාශ කිරීමේ කටයුත්තකට යනවා නම් මේක වහාම නතර කරන්න කියලා ඒ වෙනුවෙන් අපි ජනතාවත් එක්ක එකතු වෙලා පාරට බැහැලා හෝ අපේ ඩිපෝ ටික අපි ආරක්ෂා කරගෙන ප්‍රවාහන සේවය ආරක්ෂා කරන්න අපි කටයුතු කරන බව මේ අවස්ථාවේ දී මතක් කරනවා ගරු සභාපතිතුමනි. ඒ නිසා මේ ගරු සභාව දැනුවත් කළේ ගරු සභාපතිතුමනි, පෞද්ගලික ප්‍රකාශ යටතේ මේ පොදු ප්‍රවාහන සේවය අපි ආරක්ෂා කරගත යුතුයි කියන කාරණාව.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
----------------------------------------------------

ස්තුතියි ! ගරු නමින්ද අනුරප්‍රිය මන්ත්‍රීතුමනි. අදාළ බලධාරින් දැනුවත් කරමින් ඒ සඳහා

ඉදිරි ක්‍රියා මාර්ග ගැනීම සඳහා තොරතුරු ලබාදීමට කටයුතු කරනවා. මීළඟට ගරු අජිත් කුමාර මැද්දේගම ගරු මන්ත්‍රීතුමා.

***ගරු මන්ත්‍රී අජිත් කුමාර***
***கௌரவ உறுப்பினர் அஜித் குமார***
*Hon.Member Ajith Kumara*
----------------------------------------------------

ගරු සභාපතිතුමනි, මම මේ අවස්ථාවේ විශේෂයෙන් මතක් කරන්න ඕන වැලිගෙපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ රංවල මාර්ගය. අවුරුදු 15 කින් විතර මේක අළුත්වැඩියාවක් කරලා තිබුනේ නෑ. නඩත්තුවක් කරලා තිබුනේ නෑ. ගිලන් රථය පවා අනතුරකට ලක්වෙලා, ගලක් වැදිලා නතර වෙලා තිබුණා. ලෙඩාත් එක්කම. මේක අපි අනන්ත මේ සභාවේ කථා කළා. ප්‍රධාන අමාත්‍යතුමා අපේ මහා මාර්ග ඇමතිතුමා නොමැති වෙලාවේ සංඝයා වහන්සේලා, විදුහල්පතිවරු ඇවිල්ලා මෙතුමා හම්බ වෙන්න ආවාම, නොමැති නිසා ප්‍රධාන ඇමතිතුමා මුණගැහිලා මේ පිළිබඳව දැනුවත් කළා. දැන් කොහොම හරි මේ සඳහා මුදල් වෙන් කරලා පහුගිය දිනක ඒකේ වැඩ කටයුතු ආරම්භ කරලා තිබෙනවා. මට තිබෙන ප්‍රශ්නය මේකයි. මෙය ආරම්භ කිරීමට උත්සවයක් තිබිලා තියනවා. මේ උත්සවයේ දැනුවත් කිරීම් කරලා තිබෙන්නේ ඒ පළාතේ හිටපු ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙකුගේ නම සඳහන් කරමින්, ඒ ප්‍රදේශය නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයාගේ ඉල්ලීම පරිදි මේ ව්‍යාපෘතිය පටන් ගන්නවා කියලා. ඒ සඳහා අපේ අලගියවන්න

මන්ත්‍රීතුමාත් සහභාගී වෙනවා කියලා තමයි එතන ප්‍රචාරක කටයුතු කරලා තියෙන්නේ. මේ පළාත් සභාවේ මුදල් ලැබෙන්නේ ඇත්ත වශයෙන්ම මේ මාර්ග නඩත්තුව සඳහා. මේ බස් ධාවනය කරන පාරවල්. මේ මාර්ග අනිවාර්යයෙන්ම නඩත්තු වියයුතුයි. මේ මාර්ගය හොඳටම අබලන් වෙලා තියන නිසා රෝහලට යන්න බෑ. ඉස්කෝල තුනකට යන්න බෑ. පන්සල් පහකට යන්න බෑ. බොහෝම අසීරුතාවයකට ජනතාව පත්වෙලා තිබෙනවා. දැන් අපි අනන්ත මේ පළාත් සභාවේ මේක පුන පුනා කිව්වත් මේක ඒකාබද්ධ විපක්ෂයේ මන්ත්‍රීවරයෙකුගේ උවමනාව අනුව සිද්ධ වුනා කියන එක කිව්වාම ඒක ලොකු ප්‍රශ්නයක්. දැන් ඒ හැම තැනම උත්සව සංවිධාන කමිටුව ප්‍රචාරය කරලා තිබෙන්නේ ඒකාබද්ධ විපක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරයෙකුගේ යෝජනාවක් අනුව මේ කටයුත්ත සිද්ධ වුනා කියන එක. ඉතින් ඒකෙන් අපි ලොකු අපහසුතාවයකට පත් වෙනවා. අපහසුතාවයකට පත් වුනා. ඒ සම්බන්ධයෙන් අපට අපේ කිසිම සම්බන්ධයක් නැතුව මේක සිද්ධ වුනා. පුද්ගලික වශයෙන් මම ඒ උත්සවවලට කොහොමත් කැමති නෑ. මොකද පාරක් කියන එක කැඩුනාම හදන්න ඕන. ඒකට උත්සවයක් අවශ්‍ය නෑ. අවුරුදු 60 ක් විතර පරණ පාරක්. ඒක බස් ධාවනය කරන පාරක්. බස් 8 ක්, 10 ක් විතර ඔබතුමා පුද්ගලික වශයෙන් දන්නවා. ඒ කෙසේ වෙතත් මේක මේ ආකාරයෙන් ප්‍රචාරය වීම අතිගරු ජනාධිපතිතුමාටත්, ගරු අග්‍රාමාත්‍යතුමාටත්, වර්තමාන ආණ්ඩුවටත් ඒක ලොකු ප්‍රශ්නයක් වෙනවා. ඒ නිසා ලොකු අපහසුතාවයකට පත් වුනා කියන එක පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ

යෝජනා යටතේ මතක් කිරීම සඳහා තමයි කාලය ඉල්ලුවේ.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
----------------------------------------------------

ස්තුතියි ! ගරු අජිත් කුමාර මන්ත්‍රීතුමනි. පෞද්ගලික ප්‍රකාශ ඉදිරිපත් කිරීම යටතේ ප්‍රශ්නයක් ඉදිරිපත් කළාම ආයේ ඒකට පිළිතුරු ලබාදෙන්න යන්න බෑ. ඇමතිවරයාට අපි අවස්ථාව දෙනවා.

*ගරු අමාත්‍ය අතුලකුමාර රාහුබද්ධ*
*கௌரவ அமைச்சர் அதுல குமார ராஹுபத்தHon. Minister Athula Kumara Rahubadda*
-------------------------------------------------

ගරු සභාපතිතුමනි, මේක රනිල් වික්‍රමසිංහ මහත්මයාටත්, මෛත්‍රීපාල ජනාධිපතිතුමාටත් වඩා අමාරුව හැදිලා තිබුනේ අජිත් කුමාර මන්ත්‍රීතුමාට. එතුමන්ලා දෙන්නට ප්‍රශ්නයක් නෑ. ගරු සභාපතිතුමනි, මේක මේ ගෙනියන්න හදන්නේ මෙතුමා ඕන නැති දිහාවකටනේ. තමුන්නාන්සේගේ
දේශපාලනය, කුහකකම

ඒක තියාගන්න ඇග ඇතුලේ. හිත ඇතුලේ, ඔළුව ඇතුලේ. කට ඇතුලේ තියාගන්න එපා ප්‍රසිද්ධියේ. ඒක මේ තමුන්නාන්සේ ඉල්ලුවේ පාර හදන්න. ඒක මහින්ද රාජපක්ෂ මහත්මයාගෙයි, මෛත්‍රීපාල මහත්මයාගෙයි, රනිල් වික්‍රමසිංහ මහත්මයාගෙයි නෙමෙයි කිව්වේ මේක කරන්නේ පළාත් සභාවෙන්. එදා බෙරිහන් දීලා හාමුදුරුවරු ටික එව්වා තමුන්නාන්සේ. ඒ ඉවර වෙලා ගරු සභාපතිතුමා, මේක අපි ගමකට ගියේ නෑ. ගමේ කට්ටියත් එක්ක ලෑස්ති වෙලා උත්සවය ලෑස්ති කළා. උත්සවය ලෑස්ති කරනකොට නිල් පාට කොඩියක් තිබුණා

නම් රෙද්දක් ඇදගෙන තමුන්නාන්සේ කථා කරන්න ඕන මන්ත්‍රීතුමා. එක එක්කෙනා කියන ඒවා නෙමෙයි තමුන්නාන්සේ යන්න ගමට. පොදුවේ අහන්න, අජිත් කුමාර මැද්දේගමගේ කථාව කිව්වා අපි. හේෂා විතාරණ මන්ත්‍රීතුමාගේ කිව්වා. පළාත් සභාවේ හැමෝගෙම නම් කිව්වා. ඒ නිසා මේ ගෙනියන්න හදන්න එපා එක එක්කෙනා කඩේ.

ගරු සභාපතිතුමනි, මේ ප්‍රශ්නයට තිබුණ උත්තරය තමයි කඩිනමින් හදලා දෙන්න කියලා. ඒක හැදුවාම ගමේ මන්ත්‍රීතුමා උත්සවය ලෑස්ති කරන එක ද පළාත් සභාවේ අනුර මන්ත්‍රීතුමා, අනුර මන්ත්‍රීතුමාටනේ මම මේක භාරදෙන්න ඕන, කවුරු මේකේ බෙරිහන් දුන්නත්. මොකද සන්ධානයෙන්, බුලත් කොලෙන් දිනපු පළාත් සභාවක් මේක තවම. ඒක මතක තියාගන්න. මේ ගෙනිච්ච දිශාවයි වැරැද්ද. මේක මෛත්‍රීපාල මහත්මයාගේ කෙනෙහිලිකමක් හෝ රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ කෙනෙහිලිකමක් නෙමෙයි. එතුමා ඒ වැඩේ කළාම එතුමා බොහොම සුහදව කට්ටියටම ආරාධනා කළා. මම ඉන්නේ මේ ආසන දෙකකට මෙහා. මෙතුමා ඒක හොඳටම දන්නවා. එතුමා මයික් එකෙන් එතුමාගේ නම කියාගෙන ගියාද දන්නේ නෑ. තමුන්නාන්සේට

යුතුකමක් තිබුණා ඒකේ නිල් පාට කොඩියක් එහෙම තිබුණා ද බලන්න. තමුන්නාන්සේට ඒක අහගෙන හිටපු කෙනෙකුට කියන්න තිබුණා අජිත් කුමාරගේ නම තිබුණා ද කියලා අහන්න.

**(සභාවෙන් සෝෂා)**

*ගරු අමාත්‍ය අතුලකුමාර රාහුබද්ධ*
***கௌரவ அமைச்சர் அதுல குமார ராஹூபெத்த***
*Hon. Minister Athula Kumara Rahubadda*
-------------------------------------------------------

පාර පටන් ගන්න එක නෙමෙයි, වැදගත් පාර විවෘත කරන එක. මේ සභාවේ ඇවිල්ලා මෛත්‍රීපාල මහත්මයෙක් ගැන කියනවා. මෛත්‍රීපාල මහත්මයාට කෙනෙහිලිකම් කරන අය තමයි අපි. තමුන්නාන්සේ රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ ඒවා බලාගන්න. අපේ නායකයාගේ ඒවා අපි බලාගන්නම්. එතුමා අපේ නායකයා හින්දා ඒ වැඩේ කරන්නේ අපි දිස්ත්‍රික්කයේ. ඒක අපි කරගන්නම්. තමුන්නාන්සේ තමුන්නාසේගේ පක්ෂයේ ප්‍රශ්න බලාගන්න. පළාත් සභාවේ ඒවාට ඇගිලි ගහන්න එන්න එපා.

**(සභාවෙන් සෝෂා)**

*ගරු සභාපති කංචන ජයරත්න*
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
---------------------------------------------------------

ඕක දැන් ඉවර කරන්න.

*ගරු අමාත්‍ය අතුලකුමාර රාහුබද්ධ*
***கௌரவ அமைச்சர் அதுல குமார ராஹூபெத்த***
*Hon. Minister Athula Kumara Rahubadda*
-------------------------------------------------------

ඕවා නිසා තමයි ජනතාව තමුන්නාසේව පාර්ලිමේන්තු යැව්වේ නැත්තේ. පාර විවෘත කරන දවසට එන්න මාත් එක්ක.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*

-----------------------------------------------------------

කරුණාකරලා ගරු මැති ඇමතිතුමන්ලා සභාව වෙන පැත්තකට ගෙනියන්න කටයුතු කරන්න එපා. මට න්‍යාය පත්‍රයේ කටයුතු ටික කරන්න තියනවා. ඒ නිසා කරුණාකරලා හැමෝගෙන්ම ඉල්ලා සිටින්නේ බොහොම වැදගත් විදිහට අවශ්‍ය විදිහට කටයුතු කරන්න. වෙන පැත්තකට ගෙනියන්න හදන්න එපා මේ සභාව. මීළඟට විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායක සිරිපාල කිරිඇල්ල මැතිතුමා.

*ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල*
*கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல*
*Hon.Opposition Whip Siripala Kiriella*

---------------------------------------------------------

ගරු සභාපතිතුමනි, මගේ ප්‍රශ්නය අපේ ප්‍රධාන ඇමතිතුමාට. ගරු සභාපතිතුමනි, කිරිපෝරුව රෝහල ගත්තාම දොළොස් දහසකට වැඩි පිරිසකට සෙත සළසන තැනක්. මගේ හිතේ ප්‍රධාන

ඇමතිතුමා මේ සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කරයි. කිරිපෝරුව රෝහල දැන් වහලාම තමයි කිව්වොත් නිවැරදියි. මේකේ කාරණා කීපයක් ගැන මම කිව්වා. ඒ ගැන පරීක්ෂණයක් කරලා තියනවා. නමුත් අද වෙනකොට රෝහලෙන් වැඩක්ම නැති තත්ත්වයක් තියෙන්නේ. වහලයි කියලත් දෙමව්පියෝ දෙතුන් දෙනෙක් ඇවිල්ලා කිව්වා. ඒ පළාතේ ඉන්න අය. දොළොස් දාහකට වැඩි පිරිසකට සෙත සළසන තැනක් ගරු ප්‍රධාන ඇමතිතුමනි. මේකේ වෛද්‍යවරයෙකුගේ, එහේ හිටපු කාන්තාවකගේ සම්බන්ධයක් උඩ වෛද්‍යවරයාට දොස් කිව්වා කියලා ඒ වෛද්‍යවරයා හදනවාලු දැන් කිරිපෝරුව රෝහල වහන්න. ඉතින් තමුන්නාන්සේ තමයි අපේ දේවතාවෝ. මේ අහිංසක ජනතාවට වෙලා තියන අසාධාරණය වහාම කිරිපෝරුව රෝහල ගැන විශේෂ අවධානය ඔබතුමාගේ යොමු කරන්න කියලා ඉල්ලනවා. ඊයේ වෙනකොට වහලයි කියලයි ආරංචිය තියෙන්නේ. මට තව විනාඩියයි ඕන. අපි බැවිල සමගිපුර පාළම ගැන කිව්වා මේ සභාවේ. 14 ලක්ෂයක් වියදම් කරලා කැඩිලා ගියා අවුරුදු දෙකක් ඇතුළත කියලා. මේ ගැන තවම කිසිම දෙයක් ගරු සභාපතිතුමනි, වෙලා නෑ. ඉතින් මොකද ඒ පළාත ගත්තාම මම තේරුම් කරලා කිව්වා අක්කර 3000 කට, 4000 කට වැඩි ගම්මුන්ගේ ඉඩම් තියන ප්‍රදේශයක්. ගරු සභාපතිතුමනි, තේ දළු ලොරි 15 ක් දවසකට එනවා. එතකොට රබර් සම්බන්ධවත් ලොරි දෙකක් තුනක් යනවා. විවිධ භෝග සම්බන්ධයෙන් ලොරි වලින් ගත්තොත් 20 කට වැඩිය එහාට මෙහාට යන පාළමක්. දැන් මේක කඩාගෙන වැටිලත් දැනට අවුරුද්දක් වෙන්න ආවා. මේ ගැන කිසිම තැකීමක් නෑ මේ පාළම හදන්න. විශේෂයෙන්ම අවධානය යොමු කරලා මේ පාළම හදලා දෙන්න කියලා කියනවා. ඒ ප්‍රදේශයේ ඉන්න ජනතාවට සේවයක් වෙන තැනක් මෙතන.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*

-----------------------------------------------------------

හරි, මන්ත්‍රීතුමා අපි ඒ ගැන හොයලා බලලා දැනුම් දීලා තියෙන්නේ. මේ වෙනකොට මොකක්ද තත්ත්වය

කියලා ඔබතුමා දැනුවත් කරන්නම්. ගරු ප්‍රධාන ඇමතිතුමනි.

*ගරු ප්‍රධාන අමාත්‍ය මහීපාල හේරත්*
*கௌரவ பிரதான அமைச்சர்*
*Hon.Chief Minister Mahipala Herath*
**-----------------------------------------**

ගරු සභාපතිතුමනි, සිරිපාල කිරිඇල්ල මැතිතුමාගේ අදහස අනුව ඒ රෝහලේ යම්කිසි විදිහකට රෝගීන් අපහසුතාවයකට පත් වෙන තත්ත්වයක් තියනවා නම් අද දවසේ මේ සම්බන්ධයෙන් නියෝජ්‍ය පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ යවලා අපි කටයුතු කරනවා ඒ සම්බන්ධයෙන්.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
-----------------------------------------------------------

ස්තුතියි ! ගරු ප්‍රධාන ඇමතිතුමනි. මීළඟට ගරු කේ.එල්.රත්නායක ගරු මන්ත්‍රීතුමා.

*ගරු මන්ත්‍රී කේ.එල්.රත්නායක*
*கௌரவ உறுப்பினர் கே.எல்.ரத்நாயக* *Hon.Member K.L.Ratnayake* ----------
---------------------------------------

ගරු සභාපතිතුමනි, ගිය සභා වාරයේදී අපි 1 වසර ගැන කථා කළා. එදා ප්‍රධාන ඇමතිතුමාත්, අපේ අධ්‍යාපන ඇමතිතුමාත් හිටියේ නෑ. එදා කමිටුවක් පත් කළා, 1 වසර පන්ති වැඩි කිරීම සඳහා. ඒ කමිටුව පත් කරලා ඒකෙදී ලිපියක් ලැබුණා අද දින ප.ව.1.00ට කමිටුවේ සාකච්ඡාව තියනවා කියලා. ඊට පස්සේ දුරකථනයෙන් දැනුම් දුන්නා ගරු සභාපතිතුමනි, අද ඒක නෑ. මොකද විෂයය භාර අමාත්‍යතුමා ඒ පිළිබඳව සාකච්ඡා කරලා කටයුතු කරන බව. ගරු සභාපතිතුමනි, කිසිම ගැටළුවක් නෑ. මොකද ඒ පිළිබඳව අපි කමිටුව පත් කළා. මොකද දෙමව්පියෝ බලාගෙන ඉන්නවා මේ දරුවෝ ඇතුළත් කරගන්න. මේක එක පාසලක් නෙමෙයි පාසල් කීපයක් සඳහා එදා නම් කියෙව්වා. 1 වසර පටන් ගන්නවා නම් ගරු සභාපතිතුමා, අධ්‍යාපන ඇමතිතුමා අඩුම ගානේ දෙසැම්බර් 01 වෙනිදා වෙනකොටවත් මේ පන්ති වැඩි කිරීම නිර්දේශ කරලා ව්‍යූහ කමිටු තීන්දු අරගෙන නිර්දේශ කරලා ඒ පාසල්වලට යැවිය යුතුයි ගරු සභාපතිතුමා. ඒ ඒ පාසල්වලට යැවිය යුතුයි. ඒ නිසා ගරු සභාපතිතුමනි, මට අධ්‍යාපන ඇමතිතුමාගෙන් දැන ගන්න ඕන මේ කමිටුව නොතියා මේක තීන්දුවක් අරගෙන දෙසැම්බර් 01 වෙනිදා වෙනකොටවත් ඒ අවශ්‍ය කරන පාසල් සඳහා යවනවාද කියන කාරණාව. ගරු සභාපතිතුමා, මම කථා කළේ ඇඹිලිපිටිය පිළිබඳව විශේෂයෙන්. ඇඹිලිපිටිය විශේෂයෙන් පෝෂිත කලාපයේ 57 දෙනෙක් ඉන්නවා. එතකොට 39 යි පන්තියකට ගන්න පුළුවන්. ඒ නිසා ඉතිරි ටිකට යන්න පන්තියක් නෑ. පෝෂිත කලාපය තුළ. එතකොට ඒ පාසල විතරක් නෙමෙයි දේවරක්ඛිත විද්‍යාලය, ඇහැලියගොඩ ප්‍රාථමික විද්‍යාලය.

උඩුමත්ත විද්‍යාලය කියන මේ පාසල් සියල්ල තියනවා. ඒ නිසා ගරු සභාපතිතුමනි, දෙසැම්බර් 01 වෙනිදා වෙනකොටවත් ක්‍රියාත්මක කරන්න පුළුවන්ද කියන කාරණාව මම විෂය භාර ඇමතිතුමාගෙන් දැන ගන්න කැමතියි.

ඒ වගේම ගරු සභාපතිතුමනි, දැන් ඔබතුමා ආණ්ඩුකාරතුමාගේ ගරු සභාපතිතුමනි, මොකද මමත් ප්‍රාදේශීය සභාවක ඉඳලා සභාපති ධූරය දරලා, හොඳට සභාව මෙහෙයවලා 2004 ඉඳලා මේ සබරගමුව පළාත් සභාව නියෝජනය කරනවා අවුරුදු දෙකක් ඇර. ප්‍රධාන ඇමතිතුමාත් 2004 ඉඳලා මේකේ මහ ඇමති ධූරය දරුවා. මම එදා ඉඳන් අද වෙනකල් මේ සභාවේ අත්තනෝමතිකව සහ ද්වේෂසහගතව විපක්ෂයටවත් කවදාවත් වචනයක් කියලා නෑ. මොකද වාද විවාද වෙනවා. ඒවාට තමයි මේ ගරු සභාව තියෙන්නේ. එළියේ ගිහිල්ලා රංඩු වෙන්න නෙමෙයි. වාද විවාද කරලා සබරගමුවේ විසි ලක්ෂයක් වූ ජනතාව වෙනුවෙන් කථා කරන්න තියන එකම තැන මේ සබරගමුව පළාත් සභාව හැටියට අපි මහජන නියෝජිතයෝ සියළුදෙනාට. ඒ නිසා ගරු සභාපතිතුමනි, කාටවත් ද්වේෂසහගතව, කාගෙවත් තනතුරු නැති කරන්න, තනතුරුවල ඉන්න අය ..........

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
-----------------------------------------------------------

ඒ ලිපිය පිළිබඳව අපි ඉවර කරමු මන්ත්‍රීතුමා. ඔබතුමන්ලා සාකච්ඡා කරලා තිබුණා. ඒකට පිළිතුරු ඉදිරිපත් කරලා තිබුණා. දැන් ඒක ඉවර කරන්න.

*ගරු මන්ත්‍රී කේ.එල්.රත්නායක*
*கௌரவ உறுப்பினர் கே.எல்.ரத்நாயக* *Hon.Member K.L.Ratnayake*
------------------------------------------------

දැන් ආයේ ඒක පිළිබඳ නිර්දේශයක් එවලා තියනවා. කාගෙවත් රස්සාව නැති කරන්න මට උවමනාවක් නෑ. දැන් අද ඇඹේපොල විදුහල්පතිවරයා මේ නොවැම්බර් 15 වෙනකොට උඩුවක සිද්ධාර්ථයට යන්න ඕන. ඉස්සෙල්ලා දොඩම්පේ රාහුලට දැම්මාම දවස් 14 ක් ඇපිල් එකක් දාලා එකෙන් අධ්‍යාපන ලේකම්තුමා නිර්දේශ කරලා ඒ ඇපිල් එක අවලංගු කළා. ඊට පස්සේ දැන් ආණ්ඩුකාරතුමා කියපු විදිහට නොවැම්බර් 15 වෙනකල් දුන්නා. ඊට පස්සේ මොකක්ද වෙලා තියෙන්නේ ? මම ඒකයි සභාපතිතුමනි, කිව්වේ. නොවැම්බර් 15 වෙනකොට යන්න තියන එකට දැන් වෙනකොට ඇපිල් එකක් ගෙනල්ලා දීලා අධ්‍යාපන ලේකම්තුමාට. දැන් අධ්‍යාපන ලේකම්තුමාට කථා කළාම එතුමාගේ නීති පද්ධතිය තුළ එතුමාට කරන්න පුළුවන් රාමුව තුළ........

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
-----------------------------------------------------------

හරි...හරි දැන් අධ්‍යාපන ඇමතිතුමා ඉන්නවානේ සභාවේ. එතුමා උත්තර දෙයි.

*ගරු මන්ත්‍රී කේ.එල්.රත්නායක*
*கௌரவ உறுப்பினர் கே.எல்.ரத்நாயக* *Hon.Member K.L.Ratnayake*
------------------------------------------------

මම අහනවා අධ්‍යාපන ඇමතිතුමාගෙන් මේ සභාවට ඉදිරිපත් කරන්න. ඒ තියන චෝදනාවලට අනුව කළා නම් ඒ විදුහල්පතිවරයා ඉන්ටර්ඩික් වෙනවා. ගරු සභාපතිතුමා, මගේ ඉල්ලීමක් විතරක් නෙමෙයි සියළු දෙමව්පියන්ගේ ඉල්ලීම් සභාගත කරලා තියන මොහොතක මේ නිළධාරියාට ඇයි නීතිය ක්‍රියාත්මක වෙන්නේ නැත්තේ ?

*ගරු සභාපති කංචන ජයරත්න*
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

-----------------------------------------------------------

දැන් අපි කථා කරන්නේ පැහැදිලිය තේරුම් ගන්න අපි මේ කථා කරන්නේ න්‍යාය පත්‍රයේ පෞද්ගලික ප්‍රකාශ කිරීම් යටතේ. ඒ නිසා ගරු මන්ත්‍රීතුමන්ලාට දැඩි සේ අවවාද කරනවා රීති තුළ පෞද්ගලික ප්‍රකාශ කිරීම් යටතේ තියන ප්‍රතිපාදන පදනම් කරගෙන කටයුතු කරන්න. නැත්නම් මේක මොන්ටිසෝරිය වගේ වෙනවා ඊළඟට. ගරු අධ්‍යාපන ඇමතිතුමා මේ කාරණාව ගැන පැහැදිලි කරන්න.

*ගරු අමාත්‍ය භාණු මුනිප්‍රිය*
***கௌரவ அமைச்சர் பானு முனிப்பிரிய*** *Hon. Minister Bhanu Munipriya*

-----------------------------------------------------------

ගරු සභාපතිතුමා, මම අපේ කරුණාපාල ගරු මන්ත්‍රීතුමාත්, අනුර අලගියවන්න මන්ත්‍රීතුමාත් ප්‍රශ්න එකතු කරන්න ඕන කියලා කිව්වා. නමුත් ඔබතුමාගේ අවසරය මත මම මේ කාරණා ටික ඉදිරිපත් කරන්නම්. ඊට එහා තියන ප්‍රශ්න තියනවා නම් අදාළ තැන්වල දී කථා කරන්න. විශේෂයෙන්ම පළවෙනි වසර නැවත ආරම්භ කිරීමට ඉල්ලුම් කළ පාසල් සම්බන්ධයෙන් පසුගිය සභාව රැස් වූ වෙලාවේ දී ගරු මන්ත්‍රීතුමන්ලා විසින් ඒ පිළිබඳව ප්‍රශ්න යොමුකොට අවසාන වශයෙන් ගරු සලිත කරුණාරත්න මන්ත්‍රීතුමාගේ සභාපතීත්වයෙන් යුතු කමිටුවක් නම් කරලා තිබුණ, මේ සම්බන්ධයෙන් සාකච්ඡා කරලා, කරුණු ඉදිරිපත් කරලා තීන්දුවක් ගන්න. ගරු සලිත කරුණාරත්න මැතිතුමාගේ සභාපතීත්වයෙන් තිබුණ කමිටුව රැස් කරන්න තිබුනේ අද. නමුත් එතුමා එක්ක කරපු සාකච්ඡාවකුත්, ලේකම්තුමා එක්ක කරන ලද සාකච්ඡාවකුත් අනුව අපි ඒ රැස්වීම අවලංගු කළේ අද වෙනකොට එකේ තත්ත්වය පහදලා දීලා අපි ව්‍යූහ කමිටුවේ ඉතිරි ප්‍රශ්න විසඳාගන්න. ඒ අනුව පළමු වසර නැවත ආරම්භ කිරීමට ඉල්ලුම් කළ පාසල් 21 යි. වැඩි වශයෙන්ම ඉල්ලුම් කරන්නේ පසුගිය වසරේ ද්විතීක පාසල් වශයෙන් නම් කරපු පාසල්වල 1-5 පාසල් ඉවත් වීම හේතුකොට ගෙන ඇති වී තිබෙන ප්‍රශ්නය. ඒක ඉතාමත්ම ප්‍රායෝගික ප්‍රශ්නයක් මේක. ඒ කියන්නේ 1-5 අපි අයින් කළේ තව පාසලක් දීලා නෙමෙයි. එමනිසා ළඟ තියන පාසල්වලට යන්න බැරි දුරක ඉන්න දරුවන්ට ප්‍රාථමික පාසලක් ලබාදීම ඉතාමත්ම තර්කානුකූලයි. ඒ අනුව ආපු පාසල්වල යෝජනාවලින් මේ වනවිට

නැවත පළවෙනි වසර ආරම්භ කිරීමට අවසර ලැබුණ පාසල්වල නම් ටික.

ඇඹිලිපිටිය කඹුරුගමුව මහා විද්‍යාලය, නිවිතිගල කලල්ඇල්ල සාගර පලන්සූරිය විද්‍යාලය, නිවිතිගල පලාවෙල මහා විද්‍යාලය, නිවිතිගල රඹුක මහා විද්‍යාලය, ර/ඇරැපොල ශ්‍රී මහින්ද මහා විද්‍යාලය, ර/දොඩම්පේ රාහුල මහා විද්‍යාලය, ර/පාතගම විද්‍යාලය, කෑ/දෙහි මානියංගම මහා විද්‍යාලය, කෑ/දොරවක මහා විද්‍යාලය, කිවුල්නාග මහානාග මහා විද්‍යාලය,

මේ අනුව පාසල් 21 කින් 10 ක් මේ වෙනකොට මම යොමු කරපු ව්‍යූහ කමිටුවෙන් නැවත පාසල් ජනවාරි මාසයේ ආරම්භ කරන්න නීත්‍යානුකූලව අවසර දීලා තියනවා. ඊළඟට තව 10 ක් තියනවා නැවත සළකා බලා කටයුතු කරන්න. ඒක අද ව්‍යූහ කමිටුව හැටියට ලේකම්තුමා සහ ඒ නිළධාරී මණ්ඩලය එකතු වෙලා අදාළ නිර්දේශ මා වෙත දීමට නියමිතයි. ඊළඟට තව නව පන්ති ආරම්භ කරන්න, ඒ කියන්නේ අපි දීලා තියනවා. ඒක වැඩි කරන්න ඉල්ලන එක. ඒක සම්බන්ධයෙන් වෙනමම කණ්ඩායමක් සියළුම තොරතුරු එක්ක, දැන් අපි දන්නවා නගරයක තියන පාසලක් සමාන්තර පන්ති තුනක් තිබුණාම හතර වෙනි එකට ඉල්ලන අය බොහෝදුරට තව තමාට ප්‍රාථමික පාසලක් ලඟ තියන අයගේ ඉල්ලීම් වෙනවා. ඒක නෙවෙන්න පුළුවන් තැන් තියනවා. මේක ගැන තර්ක කරන්න එපා. මම මේ කියන කාරණයක්. අපි ඇසූ දුටු කාරණයක්. ඒ කියන්නේ පන්ති හතරක් තියනවා කියලා කියන්න. මේ පන්ති හතරට දරුවෝ ඇතුල් වෙනවා ඒ ගම ඇතුලෙන්. පස්වෙනි පන්තියට 40 බලනකොට ඒ පස්වෙනි පන්තියට 40 ඉල්ලන අය වැඩිදෙනා අර පෝෂක කඳවුර ඇතුළේ නෙමෙයි. ඊට පිටින් ඉන්නේ.

සමහර තැනක පෝෂක කඳවුරෙන් ගිය පාර හතරක් නියම කළත් ගිය පාරත් පෝෂක ඇතුලෙන් පහක් නියම කළයුතුව තිබුණා. ඒ කියන්නේ ගම ඇතුළෙම දරුවෝ 200 ක් ගන්නවා වෙනුවට ගම ඇතුළේ 250 ක් ආවා. නමුත් ගත්තේ 200 යි. අන්න ඒවා හරියටම ලිපිනය සමඟ තොරතුරු ටික අපි කලාප කාර්යාලයට එවන්න කියලා නියම කරලා තියනවා. ඒ අනුව ඒක තීන්දු කරන්න. ඉතින් ඒක තමයි තත්ත්වය. ඒ අනුව මේ සතියේ අද සඳුදා. මේ සතියේ බ්‍රහස්පතින්දා වෙනකොට ඒ කාරණා ටිකත් අපි නීත්‍යානුකූලව තීන්දු කරලා ඔබතුමන්ලාට දැනුම් දෙනවා. මොකද මේ පාසලක් වැඩි කිරීම මධ්‍යම ආණ්ඩුවත් එක්ක තියන ප්‍රශ්නයක් තියනවා. පාසල් අපේ රටේ තියෙන්නේ 9200 නම් අපි අළුතෙන් ප්‍රාථමිකයක් පටන් ගන්නවා නම් ඒක 9201 ක් වෙනවා. ඊළඟට පන්ති පටන් ගන්නකොට වැඩි වෙනකොට ශ්‍රේණි පිළිබඳ ප්‍රශ්නයක් එනවා. නමුත් ඔබ ඉල්ලන ඉල්ලීමේ පදනමේ තමයි මමත් ඉන්නේ. ගම ඇතුලේ දරුවාට ගම ඇතුලේ පාසලේ සමාන්තර පන්ති වැඩි කරලා හෝ ඒ පාසලේ ඉඩදෙන්න ඕන. එපමණයි ගරු සභාපතිතුමනි.

*ගරු මන්ත්‍රී කේ.එල්.රත්නායක*

*கௌரவ உறுப்பினர் கே.எல்.ரத்நாயக* *Hon.Member K.L.Ratnayake*

----------

--------------------------------------

ගරු ඇමතිතුමා, මෙතනදී ළමයි 50 ක් හිටියානේ ඉස්සෙල්ලා. ඒ ළමයි 50 එක පාරට 40 කලානේ. එතකොට අවුරුද්දෙන් අවුරුද්ද එක එක්කෙනා අඩු කරනවානේ. ගරු ඇමතිතුමා මෙතන දී ප්‍රශ්නය තියෙන්නේ එතකොට ලබන අවුද්ද වෙනකොට 38 වෙනවා. එතකොට පෝෂිත කලාපය තුළ ඉන්න දරුවන්ට යන්න තව පන්තියක් අවශ්‍යයි. ඒක තමයි

අපි ඉල්ලීම කළේ. පිට ඉන්න අය ගන්න නෙමෙයි. එතකොට අර 50 සීමාවේ ඉන්නකොට කොහොම හරි රිංගෙව්වා. කුකුල් පැටව් වගේ හිටියා. දැන් මේක 39 කළා. අවුරුද්දෙන් අවුරුද්ද එක එක්කෙනා අඩු වෙනවා. එතකොට අපි 40 යි කියමුකෝ. ඒ 10 සීමාව කොහේද යන්නේ ? දැන් ඒ පෝෂිත කලාපය තුළ ඔබතුමා කිව්වා වගේ ඔබතුමා පිළිගන්නවා ළමයි 250 ක් ඉන්නවා නම් ඒකෙන් 200 ක් යනවා. 50 ක් යන්න තැනක් නෑ. එතකොට ඒ ළමයි කොහාටද යන්නේ ?

*ගරු අමාත්‍ය භානු මුනිප්‍රිය*

*கௌரவ அமைச்சர் பானு முனிப்பிரிய* *Hon. Minister Bhanu Munipriya*

---

අපේ රත්නායක මන්ත්‍රීතුමා කියන කාරණාව ඉතාම පැහැදිලියි. පන්තියට 50 ක් හිටියා, 40 කරපුවාම පන්ති 10 ක් තියනවා නම් 50 ක් එතනම එළියේ. එතකොට ඒ ළමයින්ටත් අපි දෙන්න ඕන. භෞතික සම්පත්, කෝ ගොඩනැගිලි ? කෝ අළුත් පන්ති ? නමුත් අපි ඒක නිසා පසුගිය අවස්ථාවේ කළේ පන්තියකට අපි 45 කළා. 47 කළා. මොකද අර 50 ම තියන්නේ නැතුව එක, දෙක අඩු කරලා තිබ්බා. හැබැයි විදුහල්පතිවරුන්ට අපි චක්‍රලේඛණය අනුව 45 ට වඩා එකක්වත් ගන්න විදුහල්පතිවරු කැමති වුනේ නෑ. ඒකට හේතුව එයාගේ රැකියාවට, විශ්‍රාම වැටුපට බලපාන නිසා. ඒක අපි කොහොම හරි මේ පාර විසඳා ගනිමු. මේ ප්‍රශ්නය ගෙනාපු එක හොඳයි. ඉතා පැහැදිලි විසඳුමක් ගන්න පුළුවන්.

*ගරු අමාත්‍ය රංජිත් බණ්ඩාර මැතිතුමා.*

*கௌரவ அமைச்சர் ரஞ்ஜித் பண்டார* *Hon. Minister Ranjith Bandara*

---

ගරු සභාපතිතුමනි, මටත් තියනවා අධ්‍යාපනයේ ප්‍රශ්නයක්. කාරක සභවට අපට සහභාගී වෙන්න පුළුවන්ද ?

*ගරු අමාත්‍ය භානු මුනිප්‍රිය*

*கௌரவ அமைச்சர் பானு முனிப்பிரிய* *Hon. Minister Bhanu Munipriya*

---

පුළුවන්.

*ගරු සභාපති කංචන ජයරත්න*

*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*

*Hon.Chairman Kanchana Jayarathna*

---

ස්තුතියි ! රංජිත් බණ්ඩාර ඇමතිතුමනි. මම හිතන්නේ ගරු අධ්‍යාපන ඇමතිතුමනි, රත්නායක මැතිතුමා ඉදිරිපත් කරපු කාරණාව සමස්ත ආණ්ඩු පක්ෂයේ සහ විපක්ෂයේ සියළුම ගරු මැති ඇමතිතුමන්ලාට පෞද්ගලිකව බලපාන ඉතාම සානුකම්පිත කාරණාවක්. ඉතින් ඒ නිසා මම හිතන්නේ වඩා හොඳයි මේ සභාවේ කටයුතු පවත්වාගෙන යන මොහොතේ දී මේක සභාවේ න්‍යාය පත්‍රය අනුව මට පවත්වාගෙන යන්න තමුන්නාන්සේලා සාකච්ඡාවක ස්වභාවයෙන් මේක එළියේ දී සාකච්ඡා කරලා එතුමා ඉදිරිපත් කළේ කමිටුවක් පත් කළා කියන කාරණාව. ඔබතුමා බොහොම පැහැදිලිව කාරණාව පැහැදිලි

කළා. එතුමාත් යම්කිසි කාරණාවක් ඉදිරිපත් කළා.

ඒ නිසා සාකච්ඡාවක් පවත්වලා මම හිතන්නේ ආණ්ඩු පක්ෂයේ, විපක්ෂයේ සියළුදෙනාටම මේක බලපාන නිසා සාධාරණ විසඳුමක් හැමෝටම ගැලපෙන ආකාරයට ක්‍රියාත්මක කරදෙන ලෙස සභාවේ සියළුදෙනා වෙනුවෙන් තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටිනවා.

**ශෝක ප්‍රකාශ යෝජනා : නැත**

**පොදු කටයුතු ආරම්භයේ දී දැනුම් දීමක් අවශ්‍ය නොවන යෝජනා : නැත.**

**පොදු කටයුතු ආරම්භයේ දී දැනුම් දීමක් අවශ්‍ය යෝජනා : නැත.**

**පළාත් සභාවේ පොදු කටයුතු : නැත**

**පෞද්ගලික මන්ත්‍රිවරුන්ගේ යෝජනා : නැත.**

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*

---

මේ අවස්ථාවේ දී විශේෂ ප්‍රකාශයක් වශයෙන් ඉදිරිපත කරනවා. ගරු ප්‍රධාන අමාත්‍යතුමාට නිවාඩු අනුමත කරනු ලැබුවා අද දින. නමුත් එතුමා අසනීප තත්ත්වයෙන් සිටියදීත් මේ අවස්ථාවේ සභාවට සහභාගී වෙනවා. ඒ අනුව එතුමාට නිවාඩු අනුමත

කරපු කාරණය අවලංගු වෙනවා. එසේ කළ නිවේදනය හැන්සාඩ් එකෙන් ඉවත් කරන ලෙස උපදෙස් දෙනවා.

**සභාව කල් තැබීමේ යෝජනාව :**

*ගරු සභානායක අසෝක ජයවර්ධන මැතිතුමා.*
*கௌரவ ஆ.கட்சி அமைப்பாளர் அசோக ஜயவர்தன*
*Hon.Gov.Whip Asoka Jayawardane*

---

ගරු සභාපතිතුමනි, මෙම ගරු සභාව 2016 නොවැම්බර් මස 28 වෙනි දින පෙරවරු 10.00 දක්වා කල් තබන ලෙස මම යෝජනා කරනවා.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*

---

ස්තුතියි ! ගරු සභානායකතුමනි. 2017 වසර සඳහා අයවැය යෝජනා ඉදිරිපත් කිරීම 28 වෙනිදා ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වෙනවා. අපි ඉන් අනතුරුව ඉදිරි දින කිහිපය තුළදී ඔබතුමන්ලාට වැය ශීර්ෂයන් සඳහා විවාදය පැවැත්වෙන දිනයන් තමුන්නාන්සේලාට දැනුම් දෙන්න කටයුතු කරනවා. ඊට හේතුව වෙලා තිබුනේ පළාත් සභාව වෙත ලිඛිතව 2016 වර්ෂය තුළ වෙන් කරන ලද මුදල් සංඛ්‍යාව පිළිබඳව සංඛ්‍යා ලේඛණ හා දත්ත ලැබීමේ ප්‍රමාදයක් තිබුණා. ඒ කොටස ප්‍රමාද වීම නිසා තමයි. නැත්නම්

ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් අද දවසේත් සූදානම් වෙලා හිටියා ඉදිරිපත් කිරීම සඳහා. ඒ ප්‍රමාදයන් වීම නිසා අපට යම්කිසි කාලයක් ගන්න සිද්ධ වුනා. කෙසේ වෙතත් මේ

මාසයේ 28 වෙනිදා එය පැවැත්වීම සඳහා කටයුතු සූදානම් කරලා තියනවා කියන එක තමුන්නාන්සේලාට මතක් කරන්න ඕන.

**සභාව කල් තබන අවස්ථාවේ යෝජනා :**

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
---------------------------------------------------------------

ඒ සඳහා ගරු නියෝජ්‍ය සභාපති උදයකාන්ත ගුණතිලක මැතිතුමා.

***ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක***
***கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக***
*Hon.D.Chairman Udayakantha Gunathilaka*
---------------------------------------------------------------
-

ගරු සභාපතිතුමනි, අපේ කෑගලු දිස්ත්‍රික්කයේ සී, ඩී පාරවල් ඒ කියන්නේ පළාත් මාර්ග සහ ප්‍රාදේශීය පාරවල්වලට මාර්ග සංවර්ධන අධිකාරියෙන් ඒ කියන්නේ ආර්.ඩී.ඒ. එකෙන් මුදල් වෙන්කරලා කෑගල්ල මාර්ග සංවර්ධන අධිකාරිය හරහා ක්‍රියාත්මක වෙනවා පාරවල් ගණනාවක්. ඒ පාරවල්වල අපි පහුගිය දවස්වල දැක්කා මම ඊයෙත් දැක්කා වරකාපොල කොට්ඨාශයේ පැණිහෙල අල්ගම පාර. එතකොට ඒ පාරවල්වල කිසිම ප්‍රමිතියකින් තොරව තමයි වැඩ සිද්ධ වෙන්නෙ. කිසිම තාක්ෂණික ක්‍රමවේදයකට නෙමෙයි පාරවල් සකස් කරන්නේ. ලොකු මුදල් දැන් වර්තමානයේ කියනවා නම් අවභාවිතාවක් වෙනවා කියලා තමයි පේන්නේ. එක හමාරේ ගල් අතුරලා, විප්ස් ගල් දාලා තළලා තාර දානවා. මම පහුගිය

දවසක දැක්කා වරකාපොල කොට්ඨාශයේ හුණුවල, මංගෙදර, හුණුවල්කන්ද පාර පළවෙනි තාර ඇතිරීම කරලා තිබුණා. මුළු පාරෙම ගල් ටික ඔක්කෝම ගැලවිලා තිබුනේ. ඊට පස්සේ ඒවා ආපහු තළලා තාර දාලා තිබ්බා. ඒවායේ අපි දන්නවා ඉස්සර තාර දාලා තිබුණා අතීතයේ අවුරුදු 25 කට, 50 කට තාර දාපු පාරවල් සමහර තැන්වල අදත් තියනවා. ඒ හතරේ ගල දාලා. ඒ වගේම ඉස්සර තිබුණා දෙකේ ගල. හතරේ ගල දාලා තළලා, දෙකේ ගල දාලා තළලා, ඊළඟට තුන්කාලේ ගල දාලා තළලා, ඊට පස්සේ තමයි තාර දාන්නේ. දැන් මේක එක හමාරේ ගල පාරේ අතුරලා, විප්ස් ගල් දාලා පාර තළලා තාර දැම්මාට එහෙම පවතින්නේ නෑ. අපේ සබරගමුව පළාත ගත්තාම වැසි අධික පළාතක් හැටියට මඩ සහිත පාරවල් තියෙන්නේ. ඉතින් මේක මහා මුදල් නාස්තියක්. සමහර පාරවල්වල ලක්ෂ 80, 90 වෙන් කරලා තියනවා. ඒ පාරවල් සම්පූර්ණයෙන්ම ගැලවිලා විනාශ වෙලා යන තත්ත්වයට පත්වෙලා තියනවා මාස 5 ක් වත් මේ පාරවල් තියෙන්නෙ නෑ මේ තත්ත්වය නිසා. මහා මුදල් නාස්තියක් සිද්ධ වෙනවා කියන කාරණාව මේ අවස්ථාවේ දී මතක් කරනවා. ආර්.ඩී.ඒ. එක බොහොම උසස් තාක්ෂණයක් තිබුණ ආයතනයක්. ඉතින් මෙහෙම උසස් තාක්ෂණයක් තිබුණ ආයතනයක් මේ තත්ත්වයට වැටිලා තියෙන්නේ ඇයි ද කියන කාරණාව මට ඉතාමත් පුදුමයි. ප්‍රාදේශීය සභාවකවත් මෙහෙම සිද්ධ වෙන්නේ නෑ. කාර්මික නිළධාරින් එහෙම ඇස්තමේන්තු සකස් කරන්නේ නෑ.

නමුත් මේ රටේ ප්‍රධාන පාරවල් හදන ආයතනයක් ආර්.ඩී.ඒ එක හරහා පාරවල් මෙහෙම විනාශ වීම බොහොම කණගාටුදායක තත්ත්වයක්. ඒ නිසා මේ පාරවල් පිළිබඳව පරීක්ෂණයක් පවත්වලා මේවා ප්‍රමිතියකින් හදන්න මධ්‍යම ආණ්ඩුවේ ඒ ඇමතිතුමාට, මාර්ග සංවර්ධන අධිකාරියේ සභාපතිතුමාට දැනුම් දීලා අවශ්‍ය වැඩ පිළිවෙලක් හදනවා නම් මේ

මුදල් නාස්තිය වළක්වන්න පුළුවන් කියලා මම විශ්වාස කරනවා.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
---------------------------------------------------------

ස්තුතියි ! ගරු නියෝජ්‍ය සභාපතිතුමනි.

*ගරු අමාත්‍ය අතුලකුමාර රාහුබද්ධ*
*கௌரவ அமைச்சர் அதுல குமார ராஹுபத்த*
*Hon. Minister Athula Kumara Rahubadda*
---------------------------------------------------------

ගරු සභාපතිතුමනි, මම මීට මේ සභාවේම මේ මාර්ග පිළිබඳව මේ විනාශය කිව්වා. මොකද ඒකටත් මේ පූර්වාදර්ශය වැරදි විදිහට අපේ මාර්ග ටික වෙනත් ආයතන සහ වෙනත් අධිකාරී මඟින් ඉටුකිරීමේ දී අපේ පසු විපරමක් ඒ වගේම අපේ තාක්ෂණයක්, අපේ අධීක්ෂණයකින් තොරව කිරීම නිසා එදාත්, අපේ ආණ්ඩුව කාලවලත් ඒ වැරද්දම සිද්ධ වුනා. ඒ නිසා දැනුත් සිද්ධ වෙනවා. මේ වැරැද්ද මම දැනට මාසයකට කලින් කිව්වා.

ඒකේ ප්‍රතිඵලය අද වෙනකොට ඒ වගේම කාර්මික නිළධාරී කිසිදු සොයා බැලීමකින්, අඩු තරමින් නිරීක්ෂණයකින් ඒ වගේම තාක්ෂණ ක්‍රමයකින් තොරව තමයි ඔවුන්ගේ අභිමතාර්ථය මත දවසින් ඇස්තමේන්තු කරනවා මාර්ග සංවර්ධන අධිකාරිය. පහුවදාට ඇස්තමේන්තුව බාරදෙනවා කොන්ත්‍රාත්කාර ආයතනයට. මේ පිළිබඳව කිසිදු විපරමක් සහ

අධීක්ෂණයක් පළාත් සභවට ලබාදීලා නෑ. මේ වෙනකල් ලබාදීලාත් නෑ. ඒ නිසා අපි අදාළ අමාත්‍යාංශයට අපේ පාරවල් නිසා මේ කාරණාවල් යොමු කරන්න එතුමාගේ යෝජනාව අපි භාරගන්නවා.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
---------------------------------------------------------

ස්තුතියි ! ගරු පළාත් මාර්ග අමාත්‍යතුමනි. මීළඟට ගරු ආරියවංශ බාලසූරිය මැතිතුමා.

*ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල*
*கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல*
*Hon.Opposition Whip Siripala Kiriella*
---------------------------------------------------------

සභාපතිතුමනි, සමාවෙන්න. මට පොඩි අවස්ථාවක් දෙන්න. මේකේ බලධාරියා ආර්.ඩී.ඒ එක නම් ආර්.ඩී.ඒ එක විශේෂයෙන් දැනුවත් කරන්න. ගරු ඇමතිතුමනි, නැත්නම් මේක හරිම ප්‍රශ්නයක්. මොකද තාර දාන ඒවායේ අගල් 4 දාන්න ඕන. දෙක දාන්න ඕන.

තුන්කාල දාන්න ඕන. විප්ස් දාන්න ඕන. එහෙම තමයි දාන්නේ. ඉතින් මේ තමුන්නාන්සේ කියපු ආකාරයට පාරක් පවතින්නේ නෑ. ආර්.ඩී. ඒ එක තමයි දැනුවත් කරන්න ඕන වහාම.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
------------------------------------------------------------

හරි, ආරියවංශ මන්ත්‍රීතුමා.

*ගරු මන්ත්‍රී බී.ආරියවංශ*
*கௌரவ உறுப்பினர் பீ.ஆரியவங்ஷ* *Hon.Member B.Ariyawansha* ------
------------------------------------------

ගරු සභාපතිතුමනි මගේ සභාව කල් තබන අවස්ථාවේ යෝජනා යටතේ මටත් රත්නපුර දිස්ත්‍රික්කයේ සංවර්ධනය වෙන මාර්ග කීපයක් පිළිබඳ සඳහන් කරන්න ඕනේ. මේ වෙන කොට පළාත් මාර්ග කාපට් කිරීම යටතේ රත්නපුර දිස්ත්‍රික්කයේ මාර්ග 36 කට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හරහා ලබාගෙන අර අතුල ඇමතිතුමා දන්නවා මාර්ග ඇමතිතුමා දන්නවා මේ මාර්ග සංවර්ධනය කරන්න මුදල් වෙන් වෙලා තියෙනවා. මේ වෙන කොට මාර්ග 36 න් 18 ක් තමයි ටෙන්ඩර් ලබාගෙන තියෙන්නේ. ඒ ටෙන්ඩර් ලබාගෙන ඒ මාර්ග මේ වෙන කොට කඩිමුඩියේ ඒ කොන්ත්‍රාත්කරුවන් විසින් සංවර්ධනය කරනවා මොකද කොලොන්න ප්‍රදේශයේත් කැලිකන්ද මාර්ගය,හේෂ්වත්ත මාර්ගය ඒවගේම ආරච්චිකුඹුර වගේ මාර්ග සංවර්ධනය කරනවා දිවා රාත්‍රී දෙකේම මේ අය මේ මාර්ග ඉවර කරන්න තමයි බලන්නේ. ඒත් මේ මාර්ග සංවර්ධනය කරන්න තව මාසයක් වගේ කෙටි කාලයක් තියෙන්නේ. මේ කෙටි කාලය තුළ මේ මාර්ග සංවර්ධනය කරන්න බෑ මොකද විශාල මුදල් ප්‍රමාණයක් වෙන් වෙලා තිබෙනවා. ඒත් අපිට දැන ගන්න ලැබුණ ආකාරයට මේ මුදල් ජනවාරි 31 න් පස්සේ මේ මුදල් නැවත ලැබෙන්නේ නෑ මේ මාර්ග සංවර්ධනය කරන්න. ඒ නිසා මේ රත්නපුර දිස්ත්‍රික්කයෙන් මාර්ග 36 න් 18 ක්ම මේ වෙන කොට ටෙන්ඩර් ලබාගෙන නෑ. මේ මුදලුත් නැවත යනවා. ඒවගේම මේ සංවර්ධනය කරන්න වෙන් වුණ මාර්ගවලත් සංවර්ධනය කර ගන්න බැරි තත්ත්වයක් තමයි උදා වෙලා තියෙන්නේ. මොකද මේ දිනවල අධික වර්ෂාව නිසා. ඒ නිසා ගරු සභාපතිතුමනි අපේ පළාත් මාර්ග ඇමතිතුමාත් ඉන්න හින්දා මම විශේෂයෙන් සඳහන් කරන්න ඕනේ. අපි මේ සංවර්ධනය වෙන මාර්ග 18 ත් ටෙන්ඩර් ලබා ගත්ත නොගත්ත මාර්ග 18 ත් නැවත සංවර්ධනය කර ගැනීම සඳහා අවශ්‍ය කරන කටයුතු ටික කරලා දෙන්න කියලා ඉල්ලා සිටිමින් ඒවගේම රත්නපුර දිස්ත්‍රික්කය තුළ මාර්ග 16 ක් පමණ පළාත් සභාව මගින් ඉල්ලුම් කරලා තියෙනවා සංවර්ධනය කරන්න. කොලොන්න ප්‍රදේශයේ කපුකන්ද කියන මාර්ගය ඉතාම අබලන් තත්ත්වයේ තියෙන්නේ. ත්‍රීවිල් එකක් යන්න බැරි තත්ත්වයක් උදා වෙලා තියෙන්නේ. එම නිසා ඒ මාර්ග 16 ත් කඩිනමින් අපිට මුදල් ලබා ගත්තොත් ඒ මාර්ග 16 ගමන් කරන ජනතාවට පහසුවක් ලැබෙනවා. ඒ පිළිබඳව දැනුම් දෙමින් මේ අවස්ථාවේදී මගේ අදහස් අවසන් කරනවා.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
------------------------------------------------------------

ගරු මහා මාර්ග ඇමතිතුමා

*ගරු අමාත්‍ය අතුලකුමාර රාහුබද්ධ*
*கௌரவ அமைச்சர் அதுல குமார ராஹுபத்த*
*Hon. Minister Athula Kumara Rahubadda*
-----------------------------------------------------

ගරු සභාපතිතුමනි එතුමා කියපු කාරණාව සම්බන්ධව මුදල් ලැබුණේ මාසයක් විතර කෙටි කාලයක් තුළ. ඒ ව්‍යාපෘතිය අසාර්ථක වෙන්න හේතුව තමයි වසර අවසානයේ කඩිමුඩියේ ඇස්තමේන්තු සැකසීම සහ සීරෝ බජට් නිසා මේ දෙසැම්බර් 25 ට කලින් 31 නෙමෙයි දෙසැම්බර් 25 ට කලින් ලබා දෙන්න. රැයක් දවාලක් නෑ වැස්ස බලන්නේ නෑ ඉතාම අපරික්ෂාකාරී විදිහට ඒවගේම නොවිධිමත් විදිහට තමයි මේ මාර්ග සියල්ලම ප්‍රමිතියකින් තොරව හැදෙන්නේ. විශාල අපරාදයක්. මේ අපරාදය මම අපේ ආණ්ඩු කාලයේත් පෙන්නුවා. ඒ අපරාදය මේ කාලයේ වෙනවා නම් මේ අපරාද දෙකටම වන්දි ගෙවන්න වෙන්නේ මේ ඉන්න ඇමතිවරයාට හරි ඊළඟට එන පළාත් සභාවට හරි. ඒ නිසා මේක තීන්දුවක් ගන්න ඕනේ අඩු තරමින් පළාත් මාර්ග ටික හදනවා නම් ඒක හදන්න ඕනේ සල්ලි ටික පළාත් සභාවට එපා. ඒකේ අධීක්ෂණය සහ ඇස්තමේන්තු සැකසීමවත් දෙනවා නම් අඩුම තරමේ වෙනවා නම් ඒ කාල සීමාව තුළ මුල අපි විශ්වාස කරනවා අපිට ප්‍රමිතිය හදා ගන්න පුළුවන්. ඒ නිසා ඔබතුමන්ලා අයවැයේදී යෝජනාවක් ගේන්න ඉතුරු පාරවල් ටික හරි ඇස්තමේන්තු ගත්තේ නැත්තේ ගරු සභාපතිතුමනි කරන්න බැරි උදවිය කඩිමුඩියේ කරලා හදන්න. හොඳට කරන කොන්ත්‍රාත් ආයතන තියෙනවා ඒගොල්ලෝ කිව්වා අපිට මේක කරන්න බෑ. අපිට ආසයි මේ වැඩේට. කරන්න බෑ වැහි කාලයත් එක්ක. ඒ නිසා උඩින් පල්ලෙන් ගහලා අපේ ආයතනයේ නම කැත කර ගන්නත් අපි කැමති නෑ. ඒ නිසා පාරවල් 16 ක් විතර ගත්තේ නෑ. කීයක් හරි හොයා ගන්න ඕනේ ආයතන ටික. දැන් රෑ එළිවෙන කන් කරනවා. උදේ වල බහින කොට වැහැලා ඉවරයි. ආපහු එන කොට පොඩ්ඩක් දාලා ගහලා දානවා. මේක ජාතික අපරාදයක් වෙනවා. දෙවෙනි වතාවට මේ මාර්ගය මේ විදිහට හැදෙන්නේ. ආපහු තුන්වෙනි වතාවට මීට වඩා මුදලක් යනවා ගරු සභාපතිතුමනි. පළාත් මාර්ග කාපට් කරපුවානේ මේ. ඒ නිසා ඒකේ ඉතුරු ටික හොඳට හදන්න තමයි මුදල් ටික ඇවිල්ලා තියෙන්නේ. හැබැයි මාස දෙකයි. මාස දෙක තුළ කරන්න බෑ. අවිච්ඡේද වෙන්නේත් නෑ. මේ මුදල් ආපහු දෙන්නේත් නෑ. ඒක තමයි බරපතලම ප්‍රශ්නය. කෙසේ වෙතත් මේ මුදල ආපසු භාණ්ඩාගාරයට යනවා. මෙතනින් හරි මේක නවත්තලා මේ වැහි කාලයත් එක්ක අඩු තරම් මේ සියළු මුදල් භාණ්ඩාගාරයට අරගෙන කරන්න තියෙන හොඳ වැඩක් හරි කරලා මේ මුදල් ටික නැවත අවුරුද්ද මුල ලබා දෙනවා නම් ඉතාම හොඳ මාර්ග ටිකක් හදා ගන්න පුළුවන්.

*ගරු සභාපති කාංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
-----------------------------------------------------

ස්තූතියි ගරු මහා මාර්ග අමාත්‍යතුමනි ඉතාම බරපතල ප්‍රශ්නයක් අපේ කොලොන්න ආසනයේ කොලොන්න ප්‍රදේශයේ අපේ බාලසූරිය මන්ත්‍රීතුමා පැහැදිලි කරන කාරණාව පිළිබඳව. ඒවගේම පවතින පත් වෙලා තියෙන තත්ත්වය පිළිබඳවත් ඔබතුමා පැහැදිලි කළා. ගරු සභාවට පැහැදිලියි. ඒ නිසා අපි සුදුසු ක්‍රියාමාර්ගයක් අරගෙන ඒ සඳහා සාධාරණයක් ඉෂ්ඨ කරලා මැදිහත් වෙන්න කටයුතු කරමුයි කියලා යෝජනා කරනවා. මීළඟට අනුර අලගියවන්න ගරු මන්ත්‍රීතුමා.

*ගරු මන්ත්‍රී අනුර අලගියවන්න*
*கௌரவ உறுப்பினர் அனுர அலகியவன்ன*
*Hon.Member Anura Alagiyawanna*
---------------------------------------

ගරු සභාපතිතුමනි මම ඔබතුමාගෙන් පොඩි කාල වේලාවක් ඉල්ලුවේ සභාව කල් තැබීමේ අවස්ථාවේදී. විශේෂයෙන්ම මීට මොහොතකට පමණ පෙර රංවල මාර්ගය සම්බන්ධව කරුණු කාරණා ටිකක් මේ සභාවේ කතා බහට ලක් වුණා. ඒ කතා බහට ලක් වුණු මොහොතේ ගරු සභාපතිතුමනි ඔබතුමාගේ මූලාසනයට අවනත වෙලා මට මා සම්බන්ධම ප්‍රශ්නයක් නිසාම මට ඒකට උත්තරයක් දීගන්නට හැකියාවක් තිබුණේ නෑ. මම ස්තූතිවන්ත වෙන්නට ඕනේ අපේ පළාත් සභාවේ පළාත් මාර්ග අමාත්‍ය තුමාට රංවල රෝහලේ රෝගියෙක් වුණාම මවක් දරුවෙක් ප්‍රශූත කරන්න රංවල රෝහලට ඇතුළත් කළාම ඒ මව එතනින් අසාධ්‍ය තත්ත්වයට පත් වුණහම යවන්න තියෙන්නේ එක්කෝ ගොඩකවෙලට එක්කෝ පල්ලේ බැද්දට. කහවත්තට මේ වගේ රෝහල්වලට. එලමල්පේ හරහා නියන්ගමින් වරාවායෙන් ගොඩකවෙලට එන්නට තියෙන මාර්ගය අබලන්. එක හදනවා පළාත් මාර්ග අමාත්‍යතුමා එතුමාගේ මුදල් ප්‍රතිපාදන දීලා පහුගිය කාලයේ වැඩ ආරම්භ කළා. ඒ මර්ගයේ යන්න බෑ. එම නිසා රෝහල අසල සිට මම එතුමාව අම්බවිල හන්දියේ ඉඳන් මගේ වාහනයේ නග්ගගෙන මම එක්කරගෙන ඉස්පිරිතාලයට යනකන්. එතුමා ඇහුවා පාරක්ද දොළ පාරක්ද කියලා. මම ඇවිල්ලාම නෑ කියලා. මම එතුමාගේ අවධානයට ලක් කළා. මිනිස්සු ඉල්ලීම් කළා අපෙන්. ඉල්ලීම් කළහම ඉල්ලීම අරගෙන ඇවිල්ලා අදාල අමාත්‍යාංශයට දෙන්නට ඕනේ දීලා මුදල් ටික වෙන් කර ගත්තා. ඉතිං කවුරු කොහොම කතා කෙරුවත් තමන්ගේ ඉන්න සංවිධාකවරයාගේ තමන්ගේ මන්ත්‍රීවරයාගේ නමත් ඇතුළත් කර ගන්න. ඇතුළත් කරගෙන ඉල්ලීම හැටියට ඉදිරිපත් කරනවා. ඒ ඉල්ලීමට මාර්ගයේ පිළිසකර කිරීමේ කටයුතු එතුමා ඇවිල්ලා ආරම්භ කළා. කිසිම කෙනෙක් නෑ ඒ පිළිබඳව මතක් කරමින් එතුමා ඒ වැඩේ ආරම්භ කළා. ඒ ආරම්භ කරළා කතාව යන අතරතුරේ රංවල රෝහලේ වෛද්‍යවරයා එතුමාවත් මාවත් හම්බ වෙලා රංවල රෝහලේ වෛද්‍යතුමාටත් වැඩියෙන් එන්න එන්න නිළ නිවස. ඒ නිළ නිවසේ හිටියොත් අන්තිම කැමති පත්‍රය ලියලා තමයි නිළ නිවස කරා වැටිලා තියෙන්නේ පුපුරලා තියෙන්නේ. ඒක එතුමාට කතා කළා එතුමා සෞඛ්‍ය ඇමතිවරයා හැටියට කතා කරලා දැනුම් දීලා අපි එදා කිව්වා අපේ අවධානයට ලක් කළේ නෑ අපිට අරන් ගියේ නෑ. අපි පෙන්නුවේ නෑ කියලා පෙන්නපු මොහොතේ ඒකට ක්‍රියාත්මක කළා. ඒ නිසා අපි එතුමාට ස්තූතිවන්ත වෙන්නට ඕනේ. මම කියන්නේ ඔබතුමාත් එක්ක ගහපු බෝඩ් එක දැන් වෙන කොට ඇල කරලා තියෙන්නේ. රංවල ඉස්පිරිතාලයට මෙහා. ඊයේ අපේ නිවසට ඇවිල්ලා දෙතුන් දෙනෙක් කිව්වා ඔබතුමා ගහලා ආපු බෝඩ් එක තියෙන්නේ මෙහෙම ඇල වෙලා කියලා. ඒක තමයි තත්ත්වය. අපි ඇල කරලා තියෙන්නේ ඒ බෝඩ් එක. කොන්ගස්තැන්න ගරු අජිත් කුමාර මන්ත්‍රීතුමාගේත් අතුල කුමාර රාහුබද්ධ ඇමතිතුමාගේත් ඔබතුමාගේත් දෙන්නගේම ගහලා එතුමාගේ ඉල්ලීමට බෝඩ් එක ගහලා පාර පටන් අරගෙන පාර හදලා තියෙනවා. අනුර අලගියවන්න ඇවිල්ලා මේ සභාවේ ඇහුවේ නෑ ඇයි එහෙම කළේ කියලා. තාමත් මේ සභාවේ සන්ධානයේ බහුතර බලයකින් ක්‍රියාත්මක වෙන පළාත් සභාවක්. ඒකයි අපි මේ කියාගෙන යන්නේ. අපිත් දහසකුත් ප්‍රශ්න මැද්දේ පද්දේබැද්ද නගරයට වැසිකිලියක් නෑ. පල්ලේබැද්ද නගරයට බස් නැවතුම්පොළක් නෑ. බස් ස්ටෑන්ඩ් එකක් තියා මගී ආවරණයක් නෑ. මම ඇවිල්ලා කතා කරලා ප්‍රධාන ඇමතිතුමාට කියලා එක්කෝටි අසූඅට ලක්ෂයක් අරගෙන

ගියා. ගිය සතියේ දිවයින පත්තරේ මේක යනවා බස් නැවතුම් පොළට මුල් ගල් තුනයි හැදුණේ නෑ කියලා. අපි ගියා බස් නැවතුම් පොළ හදන්න එක්කෝටි අසූ අට ලක්ෂයක් සල්ලි අරගෙන ගරු ප්‍රධාන ඇමතිතුමා. හැබැයි මම අබේනායක ගරු මන්ත්‍රීතුමා ගැන බොහොම ගෞරවයෙන් කතා කරනවා. මට කතා කරලා කිව්වේ ඡන්දය ඇතත් නැතත් පල්ලේබැද්දේ වැඩේ අපි දෙන්නා එකතු වෙලා කරමුයි කියලා ඒකෙදි අපිට සහයෝගය හම්බ වුණේ නෑ. ඒ නිසා පල්ලේබැද්දට එක්කෝටි අසූ අට ලක්ෂයක් නැති වුණා. ඒක නිසා කට්ටිය එකතු වෙලා ඒක හදන්න තිබුණා. හැබැයි අබේනායක ගරු මන්ත්‍රීතුමා ඒ ගින්දරටත් පැන්නා එදා. මම මඟට ඇවිල්ලා හැරිලා ආවා. කලු කොඩි දාගෙන සබරගමුවේ ප්‍රධාන ඇමතිතුමාට පල්ලේබැද්දේදී ගල් පෙරළෙයි කියලා දිවයින ප්‍රධාන සිරස්තලයේ තියෙනවා. හැබැයි දැන් දානවා දිවයින පත්තරේම උඩවලවේ මාධ්‍යවේදී මහත්තයා දානවා පල්ලෙබැද්දට මුල් ගල් තුනයි බස් නැවතුම් පොළ නෑ බලධාරීන්ගේ අවධානයට ලක් වෙලා නෑ කියලා. මේ සභාවේ අපි ඔක්කෝම එන්නේ යමක් කරන්න මිනිස්සුන්ට ඇහුන්කන් දෙන්න. ඒ නිසා මිනිස්සු මොනවා හරි කිව්වහම ඒක ඇවිල්ලා කතා කරලා ඒ පිළිබඳව අවධානය ලක් කරලා මේ වැඩේ කරන්න ඕනේ. මේ වැඩේ කරන්න බැරි නම් අපි මේකේ ඉඳලා වැඩක් නෑ. මන්ත්‍රීවරු හැටියට කටයුතු කරලා වැඩක් නෑ. අම්බෙවෙල යන්දියේ කැඩිලා තියෙන කොට ඒ නිසා තමයි මම කියන්නේ පද්දේබැද්ද දක්වා රංවල සිට දුවන මාර්ගය එතන කවුරුවත් නෙමෙයි වැලිගෙපොල ප්‍රාදේශීය සභාවේ විපක්ෂනායකතුමා ඇවිල්ලා කතාවක් කෙරුවා. බුද්ධික විපක්ෂනායකතුමා කතාවක් කරලා කිව්වා මේ සියල්ලන්ගේම නම් ටික මතක් කෙරුවා. මේ සියල්ලන්ටම කිව්වා කිව්වා ඇහැක් ඇරලා බැලුවේ නෑ කියලා. මම තමයි බලපු මිනිහා. ඒ පාර හදන එක ගැන. මම තමයි පළමු මිනිහා එතුමාව එක්කන් ගියපු. ඒ නිසා බුද්ධික වීරසිංහ අපේ විපක්ෂනායකතුමයි ඔක්කෝම නම් ටික කිව්වේ. මේක කියන්නට මේ කලබල වුණේ පාර හැදුණ නිසා. පාර හදන්න පටන් ගත්ත නිසා කලබල වුණා. ඒ නිසා මේ වැඩේ කරන්න ඕනේ. මේ කාරණාව එවලේ කතා කරන්න නැගිට්ටහම ගරු සභාපතිතුමා මූලාසනයට ගරුත්වයක් තියෙන්න ඕනේ නිසා ගරු සභාපතිතුමනි කාලය ඉල්ලා ගත්තා. ඒත් එක්කම තවත් තියෙනවා ගරු සභාපතිතුමනි. අධ්‍යාපන ඇමතිතුමාගේ අවධානයට ලක් කිරීම සඳහා. පහුගිය උපදේශක කාරක සභාවේදී ගරු අධ්‍යාපන ඇමතිතුමනි මම ප්‍රශ්නයක් අරගෙන ඇවිලල්ලා කතා කළා තමුන්නාන්සේත් එක්ක. දෙමුවාත මහා විද්‍යාලය සම්බන්ධව. මම කාගේවත් ද්වේශසහගතව පලිගැනීම සඳහා කරන වැඩේ කොළ පාටද,නිල් පාටද,රතු පාටද කියලා බලන්නේ නැතුව කරන වැඩේ හරි නම් සහයෝගය දෙන ජාතියේ වැඩ කටයුතු තමයි මෙතෙක් කළේ. ඒ නිසාම ඔබතුමාගේ අවධානයට ලක් කරමින් එතන හිටිය ගරු අධ්‍යාපන අමාත්‍යාංශයේ ගරු ලේකම්තුමාගේ පළාත් ගරු අධ්‍යාපන අධ්‍යක්ෂක තුමාගේ සහ ඇඹිලිපිටිය කලාප අධ්‍යක්ෂකතුමාගේ අවධානයට ලක් කරමින් ඉන්න නිළධාරීන් එක්ක සාකච්ඡා කළේ මේක එළියේ පහළින් සාකච්ඡා කරනවාට වඩා නිළධාරීන් බලධාරීන් ඉන්න තැන කතා කරලා යම් දෙයක් තියෙනවා නම් ඒ දේ නිවැරදි කිරීම තමයි වඩාත්ම වටින්නේ කියලා. ඒ නිසා මම කතා කෙරුවාට පස්සේ ඒ විද්‍යාලයේ ගරු විදුහල්පතිතුමා විසින් පාසැල් සංවර්ධන සමිතිය කැඳවලා තිබෙනවා කරුණු 19 ක් යටතේ. මම මේ හොයා ගත්තා. මේ එවපු ලියුම. එතුමාට ප්‍රශ්නයක් තියෙනවා නම් එතුමාට ප්‍රශ්නයක් දාලා තියෙනවා නම් එතුමා ආපු පිළිබඳ තොරතුරු අපිට ආපු දේ අපි ඒ ආකාරයෙන් පළාත් සභාවට ඇවිල්ලා සභාවේ උපදේශක කාරක සභාවේදී කතා කරලා කිව්වේ මේවා වැරදිද නිවැරදිද කියලා බලන්න කියලා. ඒකනේ

තියෙන්නේ. එහෙම නැත්නම් වැඩක් නැනේ අධ්‍යාපන අමාත්‍යාංශයකුත් වැඩක් නෑ. උපදේශක කාරක සභාවකුත් වැඩක් නෑ. ඒ නිසා එතුමා කරුණු කාරණා 19 ක් යටතේ පාසැල් සංවර්ධන සමිතියේ රැස්වීමක් කැඳවනවා. ඒකට අපිට කමක් නෑ. පාසැල වෙනුවෙන් ඒ දේ කරන්න ඕනේ. 17 වෙනි සඳහන් කිරීම තියෙන්නේ පාසැල් සංවර්ධන සමිතියේ සාමාජිකත්වය නොලබපු කණ්ඩායමක් එක්ක එක්වී දේශපාලන අධිකාරිය අධ්‍යාපන කාර්යාලය නොමඟ යවමින් බොරු චෝදනා සහ දත්ත ඉදිරිපත් කරමින් පාසැලට කිසිදු අවස්ථාවක වාචිකව සහ ලිඛිතව නොදන්වා විදුහල්පතිතුමාට සහ ගුරු මණ්ඩලය සම්බන්ධයෙන් අසත්‍ය ස්වරූපය සම්බන්ධයෙන් සඳහන් කිරීම. මම ඔබතුමා ඉදිරියේ කිව්වේ මේ කාරණා සම්බන්ධයෙන් ගුරු මණ්ඩලයට අපි කිසිදු චෝදනාවක් කළේ නෑ. ගරු අධ්‍යාපන ඇමතිතුමනි. මම යෝජනා කරනවා මට ඡන්දත් නැති වෙයි. මනාපත් නැති වෙයි. ඒකට කමක් නෑ. පස් අවුරුද්දකට වරක් විදුහල්පතිවරුන් මාරු කළ යුතුයි කියලා යෝජනා කරනවා. මේකේ තියෙන බරපතලම දේ තමයි මාධ්‍ය තුළින් දැම්මත් අපිට ප්‍රශ්නයක් නෑ. අපි ඇත්ත ඇති සැටියෙන් කතා කරන්න ඕනේ. පාසැල් සංවර්ධන සමිතිය හරහා ගන්නා වූ සියළු කොන්ත්‍රාත් ටික කරන්නේ මේ අය. ඒ නිසා දාලා යන්නට බෑ. මේ හිත් වේදනාවෙන් අපි කියන්නේ. දේශපාලන අධිකාරිය අපි බලන්නේ නෑ. අපි පාසැලට ගුරුවරයෙක් අඩුයි කිව්වහම මෙහේ ඇවිල්ලා ලේකම්තුමා ළඟ වට රවුම් දහයක්වත් කැරකිලා මේ වැඩේ කර ගන්න උත්සාහ කරනවා. එතකොට දේශපාලන අධිකාරිය ප්‍රශ්නයක් නෑ. දෙමුවාත ඉස්කෝලයේ වහල කඩා වැටෙනවා මුක්කුවක් ගහලා තියෙනවා. මං හොයලා බලලා වහලය අදලා දෙන කොට දේශපාලන අධිකාරිය ප්‍රශ්නයක් නෑ. හැබැයි අද වෙන කොට දේශපාලන අධිකාරිය නොමඟ යවමින් තමයි කටයුතු කරන්නේ. දේශපාලන අධිකාරිය අධ්‍යාපන කාර්යාලය නොමඟ යවමින් බොරු චෝදනා සහ දත්ත ඉදිරිපත් කරමින් මං ඇහුවා ශිෂ්‍යත්ව විභාගයට ඉදිරිපත් වෙලා 70 ඉහළ එක්කෙනයි සමත්. එක්කෙනෙක් 25 යි. මේ අඩුම. මේ අසත්‍ය චෝදනාද. අපි කිව්වේ මේවා හොයලා බලලා මේවාට ප්‍රතිකර්ම යොදන්න කියලා. එතකොට මේ කියන කොට තමයි මේ හිත් වේදනාවල් ටික ඇති වෙන්නේ. අපිට කියන්නේ වරෙන් ඊළඟ ඡන්දයට දෙන්නම් කියලා. නැති වුණොත් ගෙදර යනවා. මොකක්ද කරන්නේ. මේක තමයි කරන්න තියෙන්නේ. මේක පෙන්නලා මේ ආකාරයට තියලා අපිව මනාපයට බය කරලා අපේ කට වහන්න හදනවා. එහෙම කරන්න පුළුවන් ඇති. නමුත් මෙහෙම කරන්න බෑ. මේ 17 වෙනි කරුණ සම්බන්ධයෙන් පරීක්ෂණයක් කරන්න . මෙන්න තියෙනවා විදුහල්පතිවරයාගේ අත්සන. හොඳට තියෙනවා රබර් සීල් එක. කේ.එම්.මෙයාගේ නම දාලා තියෙනවා. මේ පිළිබඳව ඔබතුමාගේ අවධානයට ලක් කරලා වැඩ කටයුතු කරලා අපිට සාධාරණ උත්තරයක් ලබා දෙන්න කියලා ඉල්ලීම කරමින් ගෞරවයෙන් ඉල්ලා සිටිමින් ගරු සභාපතිතුමනි මම නිහඬ වෙනවා බොහොම ස්තුතියි.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

-----------------------------------------------------------

ස්තුතියි ගරු අනුර අලගියවන්න මන්ත්‍රීතුමා. අධ්‍යාපන ඇමතිතුමා

***ගරු අමාත්‍ය භානු මුනිප්‍රිය***
***கௌரவ அமைச்சர் பானு முனிப்பிரிய*** *Hon.*

*Minister Bhanu Munipriya*

-----------------------------------------------------------

ගරු සභාපතිතුමනි එතුමා අධ්‍යාපනය සම්බන්ධයෙන් කරන ලද ප්‍රශ්නය සම්බන්ධයෙන් පිළිතුර එතුමාත් මමත් උපදේශක කාරක සභාවේ රැස් වෙනවා. අපේ ලේකම්තුමාත් ඉන්නවා. අපි එදා තීන්දු කළා අපේ උපදේශක කාරක සභාවේ අපේ ගරු මන්ත්‍රීතුමන්ලා ඉන්නවා. එකක් තමයි අනධ්‍යයන සේවකයින් කණිෂ්ඨ සේවකයින් විනය අනුව කටයුතු නොකිරීමට වහාම පරීක්ෂණ කිරීම. ගුරුවරු අවුරුදු 8 කට වැඩි සියළු දෙනාම මේ අවුරුද්දේ අවසානයේ 31 වෙන කොට අවසානයේ ස්ථාන මාරු කිරීම සඳහා වැඩ සටහනක් හදන එක. විදුහල්පතිවරු අවුරුදු 8 කට වරක් අපි ගත්තේ අවුරුදු 8 කට වරක් වරුණ මන්ත්‍රීතුමාත් හිටියා. ඒවගේම ඔය කියන තෙමුවාත ඔය කියපු කාරණය සම්බන්ධයෙන් පරීක්ෂණයක් කිරීමට කමිටුවක් සෑදීම. එදා අපේ උපදේශක කාරක සභාවේ කතා කරපු එකේ වාර්තාවේ පිටපත ගරු මන්ත්‍රීතුමන්ලාට ගියා නම් මේ ප්‍රශ්නය එන්නේ නෑ. ඒක අපේ පැත්තෙන් වෙලා තියෙන වරදක් බවයි පේන්නේ. ඒ නිසා වහාම මම අද වෙන කොට සියළුම එදා ගත්ත තීන්දු සම්බන්ධයෙන් වාර්තාව උපදේශක කාරක සභාවේ සියළුම ගරු මන්ත්‍රීතුමන්ලාට ලැබෙන්න සලස්වනවා. උපදේශක කාරක සභාවට ඕනම ගරු මන්ත්‍රීතුමෙකුට ඇවිල්ලා නම් වෙන මන්ත්‍රීවරු හැර අන් සියළුම දෙනාට විවෘතයි. සහභාගි විය හැකියි. ඔය තෙමුවාත විදුහල්පතිවරයාට විරුද්ධව එදා ගත්ත තීන්දුව අනුව පරීක්ෂණයකට යොමු කරලා තිබුණා ඒකට අපිට නිළධාරියෙක් පත් කර ගැනීමේ අපහසුව දිගටම තිබුණා. මොකද අර අලුත් ගුරුවරු උපාධිධාරී පත් කිරීමට කැප කිරීම නිසා. ඒ නිසා අද වෙන කොට කවුද නිළධාරියා පරීක්ෂණයට යන්නේ කියලා මට ලබා දෙන්න පුළුවන් ලබන 28 වෙනිදාට ඉස්සෙල්ලා ලිඛිතව ගරු අනුර අලගියවන්න මන්ත්‍රීතුමාට පරීක්ෂණය සඳහා යන නිළධාරියාගේ නමත් ඉදිරිපත් කරන්නම්.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*

-----------------------------------------------------------

ස්තූතියි ගරු අධ්‍යාපන අමාත්‍යතුමනි. මීළඟට වරුණ ලියනගේ ගරු මන්ත්‍රීතුමා.

*ගරු මන්ත්‍රී වරුණ ලියනගේ*
*கௌரவ உறுப்பினர் வருண லியனகே* *Hon.Member Waruna Liyanage* --

-----------------------------------------------------

ගරු සභාපතිතුමනි මම ඔබතුමාට මේ කතා කරන්න යන්නේ පහුගිය දවස්වල මාධ්‍ය මගින් දිගින් දිගටම මාධ්‍යන් ගියා පහුගිය කාලයේ තපස්සරකන්ද නාය යෑම සම්බන්ධයෙන් විශාල වගකීමක් රාජ්‍ය පළාත් සභා දෙකටම අයිතියි කියලා. ඒ කාරණය සම්බන්ධයෙන් දැනුවත් කළා මේ වෙන කොට අපේ චමිල මන්ත්‍රීතුමාට අද එන්න බැරි වෙච්ච නිසා මම එතුමාගෙනුත් මේ සම්බන්ධයෙන් දැනුවත් වුණා. අපි දැක්කා තපස්සරකන්ද නාය යාමෙන් විශාල පවුල් ගණනාවක් මේ වෙන කොට අවතැන් වෙලා තියෙනවා. පවුල් 547 ක් එතකොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අරනායක මං හිතන්නේ මේ වෙන කොට හැම සම්බන්ධීකරණ කමිටුවේම මේ ගැන සාකච්ඡා කරනවා නිවාස හදන්න. අපේ ඇමතිවරු කතා කරලා තියෙනවා. මේ වෙන කොට පෞද්ගලික අංශ මැදිහත්වීම තුළින් නිවාස 200 ක් හදන්න මේ වෙන කොටත් කටයුතු කරගෙන යනවා. නමුත් තව 340 ක් හදලා ඉවර කරන්න ඕනේ

වෙන කොට ඉඩම් නිදහස් කර ගැනීමේ කටයුතු වලත් නිරත වෙනවා. නමුත් නිවාස සෑදීම සඳහා යුධ හමුදාව ත්‍රිවිද හමුදාවෙන්ම යම් යම් නිවාස සංඛ්‍යාවක් හදන්න ඉදිරිපත් වෙලා තියෙනවා. නමුත් අපිට පළාත් සභාව විදිහට නිවාස විෂය පළාත් සභාවේ තියෙනවා. සල්ලි නැතුව තියෙනවා. මම සභාපතිතුමාගෙන් ඉල්ලීමක් කරන්නේ මේ විශාල අසරණභාවයට පත් වෙලා තියෙනවා මේ ජනතාව විශාල පීඩනයකට පත් වෙලා තියෙනවා. ග්‍රවුන්ඩ් එහෙක ටෙන්ට් වල තමයි ඉන්නේ. අපි දැක්කේ ටී.වී. එකෙන්. පහුගිය දවස් ටිකේ. ඒ නිසා ලබන සතියේ අයවැය ඉදිරිපත් කරන කොට ඔබතුමාත් දැන්මම පොඩ්ඩක් මතක් කරලා මේ නිවාස කියන විෂයට මුදලක් වෙන් කරගෙන අපි මේ නිවාස පළාත් සභාවෙනුත් හදලා දෙන්න ඕනේ කියන යෝජනාව මම මේ අවස්ථාවේදී කරන්නේ. අපි දැක්කා 2004 සුනාමිය ආවට පස්සේ අපේ පළාත් සභාව ගිහිල්ලා දකුණු පළාතේ නිවාස ව්‍යාපෘතියක් කළා. අපේ පළාත තුළම මේ අසරණ ජනතාවට යම් වැඩ සටහනක් කරනවා නම් හොඳයි කියන අදහස මම කියන්නේ. ඒ නිසා මේක ඔබතුමා අනිවාර්යයෙන්ම මැදිහත් වෙලා කටයුතු කරන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
----------------------------------------------------------------

ස්තුතියි වරුණ ලියනගේ මන්ත්‍රීතුමනි ඉතාම කාලෝචිත ඉතාම සානුකම්පිත ඉතාම වැදගත් වූ යෝජනාවක් ඔබතුමා ඉදිරිපත් කළේ. මේ පිළිබඳව මුදල් අමාත්‍යවරයා හැටියට ප්‍රධාන අමාත්‍යතුමා සමඟත් ප්‍රධාන ලේකම්තුමා සමගත් සාකච්ඡා කරලා සුදුසු වැඩ පිළිවෙලක් යෝජිත අයවැය වාර්තාව අනුව කටයුතු කිරීමට මේ සඳහා මැදිහත් වෙනවා කියන එක දැනුම් දෙනවා. මීළඟට කේ.එල්.රත්නායක ගරු මන්ත්‍රීතුමා.

*ගරු මන්ත්‍රී කේ.එල්.රත්නායක*
*கௌரவ உறுப்பினர் கே.எல்.ரத்நாயக*
*Hon.Member K.L.Ratnayake*
------------------------------------------------

ගරු සභාපතිතුමනි මම මේ යෝජනාව ගෙන එන කොට ප්‍රශ්න මතු වෙන්නත් පුළුවන්. මොකද හේතුව පාර්ලිමේන්තුවේත් පළාත් සභාවේත් අපි මහ ලොකුවට කතා කරනවා කෘෂිකර්මාන්තය ගැන කතා කරනවා. පළාත් සභාවේ කෘෂිකර්ම ඇමතිවරයාට දොස් කියනවා නෙමෙයි. කෘෂිකර්ම අමාත්‍යාංශය ගැන කතා කරන කොට ගොවි සංවර්ධන නිළධාරියාගෙන් පටන් ඉහළට ගත්තහම හැබැයි දැනුම අඩු අය තමයි ඉන්නේ. මම ඒක බොහොම පැහැදිලිවම කියනවා. කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් හදනවා අමුණක් පාර අයිනේ. ගොවි සංවර්ධනතුමා ඇවිල්ලා මගෙන් අහනවා මේකේ විස්තර ටික දැන ගන්න. අහන කොට අක්කර ප්‍රමාණය කියනවා. එතුමා නිළධාරියා නම් ඒ ටික දැන ගන්නට ඕනේ. කියලා ඉවර වෙලා කියනවා මන්ත්‍රීතුමා මේකට කරින් බඩු අදින්නත් තියෙනවද කියලා. එතකොට මේක පාර අයිනේමයි තියෙන්නේ. ඉතිං මට පුදුමයි. ඒවගේ තත්ත්වයක් තුළ මම මේ යෝජනා කරන්න හදන්නේ ගරු සභාපතිතුමනි පාරවල් දෙපස අනවසරයෙන් ගොඩ කරනවා. ගොඩ කරලා බිල්ඩින් හදනවා. හැබැයි ඕකට නීත්‍යානුකූලව පියවරක් ගත්තට පස්සේ මොකක්ද වෙන්නේ. බිල්ඩින් එකත් අයින් කරලා ඉඩමත් ගොඩ දාන්න වෙන්නේ. ඕකනේ වෙන්නේ. කුඹුරු ඉඩම් පර්වස්

එකේ වටිනාකමයි ගොඩ ඉඩමේ පර්චස් එකේ වටිනාකමයි ගත්තහම අහසට පොළොව වගෙයි. ඒ නිසා ගරු සභාපතිතුමනි මම යෝජනා කරන්නේ ප්‍රධාන පාරවල් දෙපස අඩුම ගානේ අඩි 50 ක්වත් ගොඩ කරන්න දෙන්න ඕනේ. අඩි 50 ක්වත් ගොඩ කරන්න දෙන්න කියලා යෝජනා කරනවා. එහෙම කර ගත්තට පස්සේ මොකක්ද වෙන්නේ අඩුම ගානේ තැඹිලි කපන මනුස්සයා තැඹිලි ගෙඩි 100 ක් හරි විකුණලා කීයක් හරි හොයා ගන්නවා. එක්කෝ වින්කලයක් වෙන්න පුළුවන්. එහෙම නැත්නම් තේ කඩයක් මොනවා හරි පටන් ගන්නවා ගරු සභාපතිතුමනි. හැබැයි කිසිම පාඩුවක් වෙන්නේ නෑ කෘෂිකර්මාන්තයේ වී වගාවට මේ දෙපස කුඹුරු ඉඩම් ගොඩ කරන්නට දුන්නහම. ඔතෙන්දි තව ප්‍රශ්නයක් ගොඩ නැගෙයි. ඊට පස්සේ කියයි ජල සම්පාදන මණ්ඩලයෙන් හෝ පහත් බිම් ගොඩ කිරීමේ අමාත්‍යාංශයෙන් හෝ දෙපාර්තමේන්තුවෙන් මේ ගොඩ කරපු ගමන් යට වෙනවා කියලා. අඩි 50 ක් ගොඩ කරපු පලියට යට වෙන්නේ නෑ. ඇහැලියගොඩ ගත්තට පස්සේ තියෙන ඇල මාර්ග ටික ශුද්ධ කළාට පස්සේ ඒ වතුර ටික බැහැලා යන්න පුළුවන්. එහෙම නම් අර කුඹුර ඉඩමට වඩා පර්චස් එක වටිනවා. විකුණන කතන්දර නෙමෙයි මම කියන්නේ. එහෙම නම් ඕනම පුද්ගලයෙකුට තමන්ගේ ඉඩමේ යම් ප්‍රමාණයක් ගොඩ කරලා ඒකට ප්‍රාදේශීය සභාවෙන් යූඩීඒ එකෙන් අවසරයක් අරගෙන බිල්ඩින් එකක් හැදුවට පස්සේ විශාල ආදායමක් ගන්න පුළුවන් ගරු සභාපතිතුමනි. ඇමතිතුමා. එතකොට මොකද වෙන්නේ ඒ මිනිහාගේ ආර්ථිකය ශක්තිමත් වෙනවා. ඉතිං මම කියන්නේ ගරු සභාපතිතුමනි මේකට චෝදනාත් එයි මහ ලොකුවට කතා කරන කෘෂිකර්මාන්තය පිළිබඳව. ඒ නිසා මම යෝජනා කරනවා යම් ප්‍රමාණයක් ගොඩ කරලා ඒකට අවශ්‍ය කටයුතු කරන්න. ඒ අදාල දෙපාර්තමේන්තු වලට නාගරික සංවර්ධක අධිකාරියට ප්‍රාදේශීය සභාවට,ගොවිජන සේවා කොමසාරිස්තුමාට මේ ගරු සභාවට යෝජනා කරනවා එය ලබා දෙන්න කියන ගෞරවනීය ඉල්ලීම කරනවා ගරු සභාපතිතුමනි.

ඒවගේම තමයි අපේ පළාත් මාර්ග සම්බන්ධව කතා කිරීමේදී ගරු ඇමතිතුමා ඒවාට උත්තර දුන්නා. දැන් ගරු සභාපතිතුමනි ප්‍රාදේශීය සභාවක් ගත්තහම ප්‍රාදේශීය සභා පනතේ තියෙනවා 1987 අංක 42 දරණ පනතේ ප්‍රාදේශීය සභාව සතුයි සියළුම මංමාවත්. අඩි පාරක් පවා ප්‍රාදේශීය සභාව සතුයි. එතකොට ප්‍රාදේශීය සභාව තියෙනවා මහජන නියෝජිතයෝ නැති වුණත් මහජන නියෝජිතයෝ හිටපු කාලයේත් ප්‍රාදේශීය සභාවට සල්ලි වෙන් කරලා ක්‍රියාකාරී ආයතනය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය. හැබැයි ප්‍රාදේශීය සභාවට සල්ලි වෙන් කරලා ක්‍රියාකාරී ආයතනය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ක්‍රියාත්මක කරනවා. ව්‍යාපෘතිය ඉවර කරනවා. රැඳවුම් මුදල් තියෙනවා. ඒ සියල්ලත් එක්ක ප්‍රාදේශීය ලේකම්තුමිය හෝ තුමියට ඇවිල්ලා මහජනතාව කියනවද මේ පාර හදලා දෙන්න කියලා. නැහැ. එහෙම නම් මේක ප්‍රාදේශීය සභාව වෙන්න ඕනේ මේ ක්‍රියාකාරී ආයතනය. අධීක්ෂණ කටයුත්ත තියෙන්න ඕනේ ප්‍රාදේශීය සභාව. ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු තමයි ගමේ ඉන්නේ. එහෙම නම් ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ට තමයි ගමේ අය ඇවිල්ලා මහජන නියෝජිතවරු හැටියට පාර කැඩිලා කියන්නේ. එහෙම නම් ප්‍රාදේශීය සභාව ඕනේ ප්‍රාදේශීය සභාව සතු වෙන්න ඕනේ ප්‍රාදේශීය සභාවේ අධීක්ෂණය තියෙන්න ඕනේ ප්‍රාදේශීය සභා පාරවල් ටික හදන කොට. පළාත් සභාවත් එහෙමයි. පළාත් සභාවේ පාරවල් ටික හදන කොට පළාත් සභාවේ අධීක්ෂණයක් තියෙන්න ඕනේ. අමාත්‍යාංශයේ සහ මුළු පළාත් සභාවේම. එහෙම නොවුණොත් එහෙම අද මොකද

වෙන්නේ බොහෝ දේවල් අද වෙලා තියෙනවා. එල්ලාවල පාර අද යන්න බෑ. කාපට් එක .ඔබතුමා දන්නවා. ඔබතුමා අපි එක ආසනයේනේ. යන්න බෑ එහේ මිනිස්සු බනිනවා. වලවල් හැරිලා. අපි මහ ලොකුවට ඒ කාලයේ යෝජනා කරලා පාරක් කොන්ක්‍රීට් කරහම කැඩිලා ගියහම අහල පහල මනුස්සයා ඇවිල්ලා සිමෙන්ති කිලෝ පහක් අරගෙන මේ වල වහගනියි කියලා. කොහේද වහ ගත්ත තැනක් තියෙනවාද. හැබැයි තිබුණොත් දාහකට එකක් වගේ ගරු සභාපතිතුමා. ඒවගේ තමයි අධීක්ෂණය අනිවාර්යයෙන් තිබිය යුතුයි. පිට මිනිස්සු ඇවිත් පාරවල් හදයි. සල්ලි ටික අරගෙන යයි. ඒවගේම තමයි ආර්ඩීඒ එකත්. මහා මාර්ග හැම වෙලේම කතා කරන පාර අපේ ඉඩංගොඩ ඇහැලියගොඩ පාර. අනේ තුන් පොළක ඉන්නවා විරුද්ධකාරයෝ. මම අහන්නේ මේවා ඔබතුමාගෙන් අහනවා. පළාත් මාර්ග ඇමතිතුමාගෙන් අහනවා. මාර්ග සංවර්ධන අධිකාරියට නීතියක් නැද්ද. නීතියක් තියෙනවා නම් ඒ ගොල්ලෝ අයින් කරලා ඉවර වෙලා පාර හදලා දෙන්න වටින්නේ නැද්ද. ඉඩංගොඩින් පටන් ගත්තේ අඩි 36 ඇහැලියගොඩට එන කොට අඩි 32 යි. ජනවාරි 08 පස්සේ යහපාලනය හින්දා. ඕන් තත්ත්වය. පාරේ බැහැලා යන්න බෑ. යහපාලන ආණ්ඩුව. පත් කරන්න ජනාධිපතිතුමා පත් කරන්න. ආණ්ඩුව පත් කරන්න වැඩ කරපු මිනිස්සු හැටියට අපිට පාරේ බැහැලා යන්න බැරි තත්ත්වයක් තියෙනවා අද අපේ ගම්වල. හැබැයි සියඹලා ගෙනල්ලම නෑ පළාත් සභා මන්ත්‍රීවරු හැටියට මේ ආණ්ඩුව හදනනට. ඒක තමයි ඇත්ත. මාව හෙට අයින් කරයි මට ප්‍රශ්නයක් නෑ. මේ මොහොතේ කතා කරලා එළියට බැස්සම හාට්ඇටෑක් එකක් හැදිලා මැරිලා යයි. ඒත් මේ ගරු සභාවේ කතා කළහම කවදාහරි හැන්සාඩ්ගත වෙයි. කේ.එල්.රත්නායක කියන පළාත් සභා මන්ත්‍රීවරයා අයුක්තියට අසාධාරණයට කතා කරලා ගරු සභාපතිතුමනි. ඒක තමයි මම කතා කරන්නේ. අද වෙනතුරු මම රුපියලක් හම්බ කරලා නෑ. අනිත් මන්ත්‍රීවරුත් මහජන නියෝජිතවරුත් එහෙම ඇති. ඒ වුණාට ගරු සභාපතිතුමනි නීතියක් තියෙනවා නම් ඒක ආණ්ඩු පෙරළෙන්න පුළුවන් ආණ්ඩු තියෙන්න පුළුවන්. නීතියක් නම් ඒ නීතිය එහෙම ක්‍රියාත්මක වියට08 වෙනිදායින් පස්සේ එක නීතියක්. එහෙම නම් මේ ආර්ඩීඒ එකේ මහා මාර්ග අමාත්‍යාංශයේ නිළධාරීන් අවශ්‍ය නෑ. වැඩිය ඕනේ නෑ ඔබතුමා බලන්න හිඳුරංගල මම නම කියන්නේ නෑ. හිඳුරංගල ඉස්කෝලයට හැරෙන එහා පැත්තේ ගල් වැටියක් නොතිබුණු ඉඩමකට දිගටම බැම්ම ගහලා තියෙනවා. කිරිඇල්ල මන්ත්‍රීතුමා සාක්ෂි දරයි. විජේනායක මන්ත්‍රීතුමා සාක්ෂි දරයි. හැබැයි ව්‍යාපෘතිය කරන නිළධාරියාගෙන් ඇහුවම මොකක්ද කියන්නේ. ගල් වැටියක් තිබුණා. කීප පොළකම තිබුණා. අනේ අපිත් උපන්නේ ඔය ගම්වල. අපි දන්න කාලයේ ඉඳන් ගල්වැටි තිබුනේ නෑ. හැබැයි අත්‍යාවශ්‍ය වුණ තැන හැම දෙනාම හිතයි මූ ඇරූපොළ ගැන විතරමයි කතා කරන්නේ කියලා. නෑ ඇරූපොළවත් බැහැලා යන්න බැරි තත්ත්වයක් උදා වෙලා තියෙනවා මේ කරන වැඩ නිසා. ඇරූපොළ ඉස්කෝලයේ ආවා. ස්වභාවික වතුර බැහැලා යන කාණුව. හැදුවේ නෑ, මුළු පාරටම දාලා තියෙන්නේ ගරු ඇමතිතුමා වැහි කාණු විතරයි. විෂයභාර අමාත්‍යතුමා දැනුවත් කරන්න ගියා. බුදු අම්මේ 851 පෙත්සමකුත් අරගෙන. අනේ මේක අඩි 32 නෙමෙයි 36 කරන්න කියලා. විෂ්‍යභාර අමාත්‍යතුමා පුටුවෙන් නැගිට්ටා. මම හිටගෙන හිටියේ. මට වඩා පොඩ්ඩක් මිටිද දන්නේත් නෑ. සමානද දන්නේත් නෑ. කොට මිටි,උස ද දන්නේ නෑ. මගේ කරේ හිටියේ. බැහැලා ආවා ඔළුවට නගින්න ඉස්සෙල්ලා. ඕන් තත්ත්වය. විෂයභාර අමාත්‍යවරයා දැනුවත් කරන්න විදිහක් නෑ. මගේ ගේ කැඩුණද කියලා අහනවා. ඔව් පොදු කටයුත්තකට යනවා නම් මගේ ගේ වුණත් දෙනවා. කරන්න දෙයක් නෑ. මේ රටේ නීතියක් තියෙනවා. 38 ආ අතුරු වගන්තිය යටතේ පවරා ගැනීමක්

කරන්න බැරිද ගරු මාර්ග ඇමතිතුමා ගරු සභාපතිතුමා. එහෙම නම් ඇයි නීතිය ක්‍රියාත්මක කරන්නේ නැත්තේ. ඒක තමයි තියෙන බරපතලම ගැටළුව.මේක කතා කරන්න ගියොත් දැන් එළියට දායිද දන්නේ නෑ. ඒත් කිසි ප්‍රශ්නයක් නෑ. හැබැයි නීති වෙනස් වෙන්න විදිහක් නෑ ගරු සභාපතිතුමනි. ඒ නිසා බොහොම පැහැදිලිවම කියනවා ඔබතුමා දැනුවත් කරන්න මහා මාර්ග ඇමතිතුමා ඔබතුමා විෂයභාර අමාත්‍යවරයා හැටියට පළාත් මාර්ග. එහෙම කරලා ඒ පාරේ තියෙන අඩුපාඩු ටික සකස් කරන්න. ඕනේ නම් ස්ථානීය පරීක්ෂණයක් කරන්න එන්න කියන්න ගරු ඇමතිතුමා. ඔබතුමාත් එන්න ඔබතුමාත් ඒ ආසනය නියෝජනය කරනවා. නිමල් විජේනායක මන්ත්‍රීතුමා,ආසන සංවිධායක සිරිපාල කිරිඇල්ල මන්ත්‍රීතුමා ඉන්නවා. හත් දෙනෙක් නියෝජනය කරන ආසනයක පාරට එහෙමයි සිද්ධ වෙලා තියෙන්නේ. ඒ නිසා හරි කණගාටුයි කියන්න.

ඒවගේම තමයි මේ විදුහල්පතිවරු ගැන කතා කළා ගරු අනුර අලගියවන්න මන්ත්‍රීතුමා. හැබැයි කියන කොට නම් ඉවසගෙන ඉන්න බෑ. දැන් අර ඇරැපොළ ප්‍රශ්නයට උත්තරයක් දුන්නේ නෑ ගරු විෂයභාර අමාත්‍යතුමා. මේක දිගින් දිගටම ගිය අවුරුද්දේ සභාගත කරලා ඔබතුමාගෙන් උත්තරයක් බලාපොරොත්තු වුණා. ඒ උත්තරය අද වෙනකන් මේ සභාවට ඉදිරිපත් වුණේ නෑ. හරියටම අවුරුද්දක් වෙනවා ගරු සභාපතිතුමනි. මේ සබරගමු පළාත් සභාවේ විසි ලක්ෂයක් වූ අධික වූ ජනතාවට සේවය කරන ඒ අධ්‍යාපන අමාත්‍යාංශයේ අධ්‍යාපන ඇමතිතුමා අවුරුද්දක් තිස්සේ උත්තරයක් දුන්නේ නැත්නම් මේ සබරගමු පළාත් සභාවට සහ සබරගමු පළාත් සභාවේ ජීවත් වෙන වෙසෙන්නා වූ අපේ ජනතාවට දෙයියන්ගේම පිහිටයි ගරු සභාපතිතුමනි.

*ගරු අමාත්‍ය භානු මුනිප්‍රිය*

*கௌரவ அமைச்சர் பானு முனிப்பிரிய* *Hon. Minister Bhanu Munipriya*

-------------------------------------------------------------

උත්තරයක් දුන්නේ නැත්නම් හොඳ නෑ. ඇරැපොළ විද්‍යාලයේ විදුහල්පතිතුමාට පරීක්ෂණයක් කරලා ස්ථාන මාරුවක් කළේ අධ්‍යාපන අමාත්‍යාංශයෙන්. ඒකනේ ඔබතුමාගේ ඉල්ලීම තිබුණේ පරීක්ෂණයක්. අපි ස්ථාන මාරු කරන ලෙස. ඊට පස්සේ උඩින් තියෙන අධිකාරියකින් වෙන තීන්දුවක් දීලා තියෙනවා. ඒ තීන්දුව කළේ ඔබ දන්නවා අපි කළේ පරීක්ෂණය නවත්තලා ඒ පාසැලේම විදුහල්පති කළා. එහෙමයි ඒක වුණේ. අවලංගු කළා. ඒ අනුව නැවත ලේකම්තුමා තේරුම් කරලා දුන්නට පස්සේ ගරු ආණ්ඩුකාරතුමා 15 වෙනිදා දක්වා ඔහුට ඒ පාසැලේ ඉන්න ඉඩ දුන්නා. එච්චරයි වුණේ. අද අභියාචනයක් දාන්න නැවත ඉල්ලනවා. අභියාචනය නැවත ප්‍රතික්ෂේප කරලා තියෙනවා. ඒ අනුව 15 වෙනිදායින් පස්සේ ඔහු යන්න ඕනේ. මට ඒකට උත්තරයක් දෙන්න බැරි වුණා. නොගියොත් නීත්‍යානුකූලව කටයුතු කරනවා.

*ගරු මන්ත්‍රී කේ.එල්.රත්නායක*

*கௌரவ உறுப்பினர் கே.எல்.ரத்நாயக* *Hon.Member K.L.Ratnayake* ----------

----------------------------------------

දැන් ඔය ප්‍රශ්නයේදී ඔබතුමා අමනාප වෙන්න එපා මම මේ ඇත්ත කතා කරන්නේ. පහුගිය අවුරුද්දේ

සැප්තැම්බර්වල මේක සභාගත කරනවා. පරීක්ෂණයක් කරනවා. කොට්ඨාශ අධ්‍යාපන අධ්‍යක්ෂකතුමා පරීක්ෂණයක් කරලා කලාපයට යවනවා. එතකොට මාස ගාණක් ගියාට පස්සේ මම යනවා. ගිහිල්ලා බලනවා අතිරේක අධ්‍යක්ෂකතුමා ගාවට ගිහිල්ලා මොකද වෙලා තියෙන්නේ කියලා. අනේ නෑ ෆයිල් එකත් නෑ මොකුත් නෑ ගරු මන්ත්‍රීතුමා මේ එක වසර පටන් ගන්න ෆයිල් එක විතරයි තියෙන්නේ. මම කියනව නෑ සභාවට ඉදිරිපත් කරලා සභාගත කරලා මහජනතාවගේ පෙත්සම් ඉදිරිපත් කරලා මේ සභාගත කරලා තියෙනා. මේකට පරීක්ෂණ වාර්තාවක් තියෙනවා. කලාපයෙන් එනවා මේ නිළධාරීතුමියක් දුවගෙන දුවගෙන හැතිදාගෙන. සර් සර් මේ තියෙන්නේ කියලා. අන්න එතකොට තමයි එතුමා දන්නේ මෙන්න වාර්තාව. එතකොට එතුමා මාරු කරන්න සියළු දේ හොඳයි ලේකම්තුමාට දැනුවත් කරනවා ලේකම්තුමා කියනවා සේවා අවශ්‍යතාවය මත මාරු කරනවා කියලා. අපිත් ඇත්තටම මිනිහෙක් අමාරුවේ දාන්න ඕනේ නෑ. අවුරුදු විසි දෙකක් එක තැන. මිනිහෙක් අපිට ගෙදර යවන්න ඕනේ නෑ පඩි නැතුව. ඒ නිසා සේවා අවශ්‍යතාවය මත මාරු කරනවා. හැබැයි සේවා අවශ්‍යතා මත මාරු කරන කොට අපේ ලේකම්තුමා කියනවා මන්ත්‍රීතුමා මේකේ තියෙන චෝදනා ටික දැම්මොත් මිනිහාට දෙයියන්ගේම පිහිටයි. ගෙදර තමයි යන්න වෙන්නේ කියලා. එතකොට ඒ අවධානම විදුහල්පතිවරයා දන්නේ නැද්ද. ඒක තමයි මම මේ සභාවට ඉල්ලන්නේ. මේ සභාවට ඒ තියෙන කරුණු ටික අධ්‍යාපන ඇමතිතුමා ඉදිරිපත් කළාට පස්සේ ඔබතුමාට මොකක්ද කරන්න වෙන්නේ. ඉන්ටඩ්ඩ් කියලා නේද ගහන්න වෙන්නේ. අත්සන් කරන්න නේද වෙන්නේ. ඒක නැතුව නේද සේවා අවශ්‍යතාවය මත මාරු කෙරුවේ. ඒ සේවා අවශ්‍යතාවය මත මාරු කළාට පස්සේ අභියාචනය දුන්නට පස්සේ දින 14 කට පස්සේ ඒ අභියාචනයත් ලේකම්තුමා විසින් ප්‍රතික්ෂේප කරනවා. ඊට පස්සේ යනවා ආණ්ඩුකාරතුමාට. ආණ්ඩුකාරතුමා ගාවට ගිහිල්ලා කිව්වට පස්සේ තමයි කිව්වේ මේක බොරුවක් කියලා. ඉෆ්ලාර් මන්ත්‍රීතුමා සාක්ෂි දරයි. මම බොරුවක් කියනවා නම්. එතකොට මම ආණ්ඩුකාරතුමාට කිව්වා සර් ගෙනල්ලා බලන්නකෝ ෆයිල් එක. චෝදනා නැත්නම් මොකක්ද වෙන්නේ කියලා. විදුහල්පතිවරයාට වරද්දන්න නෙමෙයි අපිට වුවමනාව තිබුනේ. තියෙන චෝදනා ටික දැම්මම පළාත් මාර්ග ඇමතිතුමා ඉන්ටඩිට් වෙනවා. දැන් මේ 15 වෙනිදාට පස්සේ ආයි ඇහිල් එකක් දුන්නා. දවස් හතකින් දැන් ආයේ ගහනවා ප්‍රතික්ෂේපයි කියලා. නැවත වරක් කියයි ආයේ ජනවාරි පළවෙනිදායින් පස්සේ කියලාද මං දන්නේ නෑ. ගරු සභාපතිතුමනි මේක ඔබතුමාට වෙන්න පුළුවන්. මේක පළාත් මාර්ග ඇමතිතුමාට වෙන්න පුළුවන්. නැත්නම් මේ විෂයභාර අමාත්‍යවරයාට වෙන්න පුළුවන්. නැත්නම් මේ මහජන නියෝජිතයින්ට වෙන්න පුළුවන්. මගේ ගමේ පාසැල මිනිස්සුන්ගේ ඉල්ලීම පිට මම ගිය පාසැල හැටියට මේ පාසැලේ මුදල් වෙන් කරපු පාසැලක් හැටියට ඒකේ අත්තනෝමතික කටයුතු කරනවා නම් ඕනම කෙනෙක් අයින් වෙන්නට ඕනේ. මම වුණත් අයින් වෙන්නට ඕනේ. මෙහෙමයි ගරු සභාපතිතුමා ඔබතුමා යෝජනා කලේ අවුරුදු අටයි කියලානේ. අවුරුදු පහෙන් මාරු කරන්නට ඕනේ ඒකාධිකාරියක් බවට පරිවර්තනය වෙනවා. මේ සබරගමුවේ මිනිස්සුන්ගේ සල්ලි විතරක් නෙමෙයි. සමස්ත රටේ ජනතාවගේ බදු මුදල් වලින් තමයි අපි දීමනාවක් ගන්නේ. රජයේ නිළධාරිනුත් ගන්නේ. එහෙම නම් හරයට වැඩ කරන්නේ නැති නිළධාරීන් ඉන්නවා නම් කොයි එක්කෙනා වුණත් මාරු කළ යුතුමයි ගරු සභාපතිතුමනි.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*

-----------------------------------------------------------

අපි අවසන් කරමු ගරු මන්ත්‍රීතුමා. කේ.එල්.රත්නායක ගරු මන්ත්‍රීතුමා ඔබතුමා විසින් කාරණා කීපයක් ඉදිරිපත් කරන කාරණා කාරණා සම්බන්ධයෙන් අපි නීත්‍යානුකූලව කටයුතු කිරීම සඳහා අදාල බලධාරීන් වෙත යොමු කිරීමට කටයුතු කරනවා. ඉඩම් ගොඩ කිරීම සම්බන්ධයෙන්. අවශ්‍යමය නීතිමය කටයුතු කරන්න කියලා. ඔබතුමා කතා කරපු දෙවෙනි කාරණය සම්බන්ධයෙන් නම් මම තව වෙලාව ඕනේ නම් තවත් දෙන්නම්. ඒකට ප්‍රශ්නයක් නෑ. අර දෙවෙනියට පාර සම්බන්ධයෙන් නම්. තුන්වෙනි එක සම්බන්ධයෙන් නම් අර අධ්‍යාපන ඇමතිතුමා ප්‍රශ්නය තියෙන්නේ පළාත් සභා රැස්වීම පවත්වන්නේ න්‍යායපත්‍රානුකූලව සභාවේ කටයුතු පවත්වාගෙන යන්නට. අධ්‍යාපන කාරක සභාවේ උපදේශක කාරක සභාවක් බවට පත් වෙච්චිහම මේක ටිකක් අපි අපහසුතාවයට පත් වෙනවා. ඔබතුමන්ලා දෙපළ ඔබතුමා ප්‍රශ්නය අහනවා. ඔබතුමා උත්තරය දෙනවා. ඔබතුමා ප්‍රශ්නය අහනවා මෙතුමා උත්තර දෙනවා. අනිත් සියළු දෙනාම බලාගෙන ඉන්නවා. ඒ නිසා ඔබතුමා මැදිහත් වෙලා මේකට කඩිනම් විසඳුමක් හදලා දුන්නොත් හොඳයි. නැත්නම් අනිත් විෂයන් ගැන කතා කර ගන්න ඊළග කථිකයෝ බලාගෙන ඉන්නවා ඇයි අපිට දෙන්නේ නැත්තේ කියලා. ඒ නිසා ඒ පිළිබඳව අවධානය ලක් කරන්න කියලා. මං හිතන්නේ රත්නායක මන්ත්‍රීතුමාගේ තියෙන පීඩනය නිසාම තමයි දිගින් දිගටම මේ පිළිබඳව කතා කරන්නේ. ඒ පිළිබඳව අවධානයට ලක් කරලා කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා. මීළඟට අපේ බාස්කරන් ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

***ගරු මන්ත්‍රී අන්නමලෙයි බාස්කරන්***
***கௌரவ உறுப்பினர் அண்ணாமலை பாஸ்கரன்***
*Hon.Member A.Basgaran*
---------------------------------------------------------

මේ සභාව තුළ මේ මොහොතේ පරිවර්තනය සිදු වෙනවාද කියලා පරීක්ෂා කරලා කියන්න.

***ගරු මන්ත්‍රී එම්.වයි.එම්.ඉෆ්ලාර්***
***கௌரவ உறுப்பினர் எம்.வை.எம்.இப்லார்***
*Hon.Member M.Y.M.Iflar*
-----------------------------------------

මේ සභාව තුළ මේ මොහොතේ පරිවර්තනය සිදු වෙනවාද කියලා පරීක්ෂා කරලා කියන්න.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
----------------------------------------------------------

පරීක්ෂා කරලා දැනුම් දෙන්නම්. පරිවර්තනය සිදු වෙන්නේ නෑ. ඒක මටත් දැනුනා.

***ගරු මන්ත්‍රී එම්.වයි.එම්.ඉෆ්ලාර්***
***கௌரவ உறுப்பினர் எம்.வை.எம்.இப்லார்***
*Hon.Member M.Y.M.Iflar*
-----------------------------------------

එතුමා කියන කතාව ඇත්ත. විශේෂයෙන් සභාපතිතුමාට තේරෙන්න ඕනේ. මට තේරෙනවා.

***ගරු මන්ත්‍රී අන්නමලෙයි බාස්කරන්***
***கௌரவ உறுப்பினர் அண்ணாமலை பாஸ்கரன்***
*Hon.Member A.Basgaran*
---------------------------------------------------------

මේ අවස්ථාවේදී අපේ කාර්මික දෝෂයක් හින්දා අපේ මන්ත්‍රීවරුන්ට

මගේ මව් භාෂාවෙන් කතා කරන කොට ඒක හඳුනාගන්න බැරි ප්‍රශ්නයක් තියෙනවා .ඒ නිසා මම සිංහලෙන් කතා කරන්නම්. ගරු සභාපතිතුමනි ඉස්සෙල්ලා මම කිව්වේ ගරු සභාපතිතුමාට කලුපහන වත්ත ගැන මම කිව්වේ දැන් මාස හතක් ගිහිල්ලාත් ඒගොල්ලෝ එතනමයි ඉන්නේ. මම කිව්වේ මන්ත්‍රීවරු මේ සභාවේ අපි සියළු දෙනාම මෙතෙන්ට ඇවිල්ලා ඉන්නේ ජනතාවගේ නියෝජිතයෝ විදිහටයි මෙතනට ඇවිල්ලා ඉන්නේ. මෙතෙන්ට ඇවිල්ලා ප්‍රශ්නයක් කියන කොට ඒ ප්‍රශ්නය ගැන හොඳට හඳුනාගෙන ඒ හැඟීමත් එක්ක තමයි මෙතනට ඇවිල්ලා කතා කරන්නේ. අපිට නායකත්වය දෙන්න ඔබතුමාට ගරු සභාපතිතුමාට ප්‍රශ්නය අපි කියන කොට අඩුම තරමේ 100% බැරි වෙන්නට ඇති. ඒ වුණත් 50% හරි මේ ප්‍රශ්න වලට උත්තර ලබා දෙන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ.

ගරු සභාපතිතුමනි මේ වතුවල තැපැල් ගැන මම කතා කරලා තියෙනවා. මගේ ආධාරකරුවන්ට මම පැතුම් වගයක් යවලා තිබුණා. ඒ සුභ පැතුම් 150 ක් 200 ක් තේ කර්මාන්තයේ ඔක්කෝම දාලා තිබුණා. ඒවගේම ගරු සභාපතිතුමනි වතුවල ජොබ් එකක් අපිට බොහොම අඩුවෙන් තමයි හම්බ වෙන්නේ. මොකද අපි ඇප්ලිකේෂන් එකක් දැම්මා නම් පළාත් සභාවේ හරි 1% යි 2% හම්බ වෙන්නේ. රු.6000/- ත් එක්ක අපි ටීචින් ජොබ් එක දුන්නා. මහින්ද මහත්තයා ඉන්න කොට. ඒ ජොබ් එකටවත් ඇප්ලිකේෂන් ටික ඒ වත්තේ ළමයින්ට ගිහිල්ලා හම්බ වෙන්නේ නෑ. වත්තේ වැඩ කළේ නැත්නම් ඒ වත්තේ මහත්තයා දීලා තියෙන ලියුම් එහෙම නැත්නම් එතන ඉන්න එක්කෙනා ඒ ලියුම් අරගෙන විසි කරලා දානවා. මේක භයානක ප්‍රශ්නයක්. ඒගොල්ලන්ට ලියුම් යන්නේ නෑ. ඒගොල්ලන්ට හරි විදිහට ලියුම් යන්නේ නෑ. තැපැල් කන්තෝරුවේ හරියට පියුම්ලා නෑ. එක සැරයක් අපේ තොන්ඩමන් ඇමතිතුමා අරන් තිබුණා. කෑගලු දිස්ත්‍රික්කයටම 20 ක් විතරයි හම්බ වෙලා තියෙන්නේ. ඒකත් අපේ ගරු චන්ද්‍රිකා මැඩම් ඉන්න කොට හම්බ වෙච්චි එක. 20 ක් විතර තමයි කෑගලු දිස්ත්‍රික්කයට හම්බ වුණේ. ඊට පස්සේ 6000/- පඩියටත් එහෙම තමයි. ලියුම් ටික යන්නේ නෑ. වතුකරයේ ජනතාවට සල්ලි නැති වුණාට පවුම් දෙකේ ජේන් එකක් ගිහිල්ලා රු.20000/- රු.15000/- ට තියලා එනවා. ඉන් පස්සේ ඒක බේර ගන්න ලියුම් එන කොට ඒවා හම්බ වෙන්නේ නෑ. ඒ චේන් එක මුද්ද එහෙම්මම සින්න වෙලා යනවා. ඒක බරපතල ප්‍රශ්නයක්. ගරු සභාපතිතුමනි ගරු ඇමතිතුමනි මේක තැපැල් එකට ලියලා වහාම මේ කෑගලු දිස්ත්‍රික්කයට වතුවලට ලියුම් බෙදන්න මේ පෝස්මන්ට්ලා ලියුම් බෙදන්නෝ ලබා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

ඒවගේම මේ සභාවට කියලා තිබ්බා කිරිපෝරුව වත්තේ ගහක් කඩන් වැටිලා මිනිහා එතනම මැරිලා. ඒවගේම කැළණි වත්තේ ඊයේ පෙරේදා වැස්සටත් මම ගිහින් බලන කොට මාලිබඩවත්තේ අපේ පොල්ගම්පොල ගරු මන්ත්‍රීතුමාත් ඇවිල්ලා හිටියා. මාලිබඩවත්තේ ගහක් වැටිලා අනූ නවයෙන් බේරිලා තියෙන්නේ කට්ටිය. අපි ගස් කපන්න කියලා කිව්වා වතු වලට. ලයිම වටේට තියෙන ගස් ටික කපන්න. කොස් ගස් විතරක් සල්ලි කරන්න කපාගෙන යනවා. ඒගොල්ලෝ කොස් ගස් ටික විතරක් කපාගෙන යනවා. අනතුරුදායක ගස් ටික කපන්න කියලා අපි ඉල්ලීම් කරලා තියෙනවා. ඒ නිසා ගරු සභාපතිතුමනි කරුණාකරලා මේකට පියවරක් ගන්න ගහ කඩා වැටිලා මිනිස්සු මැරෙන්න ඉන්නේ නැතුව. ඒත් එක්කම මට තව එක්ක කියන්න කැමතියි අරක්කු දැන් ගල් බෝතලයක් අරක්ක බෝතලයක් රු.1500/- ක් විතර වෙලා. එහෙම නම් කියන්න අරක්කු බොන්න එපා කාටවත්. රු.1500/- යි.

අරක්කු බීපු මිනිහා එක පාරට නවත්තපන් කියලා කිව්වාට කොහොමද නවත්තන්නේ. දැන් වත්තේ කසිප්පු වැඩ වෙලා. රු.1500/- ක් දීලා අරක්කු බොන්න බැරි වුණහම මම කියන්නේ නෑ මමත් කැමති නෑ, මම කියන්නේ මේක මොනවා හරි පිළිතුරක් වෙන්න ඕනේ. එක පාරට රු.1500/- ක් දීලා සල්ලි තියෙන මිනිහාට අරක්කු බොන්න පුළුවන්. නැති මිනිහාට බෑ. දැන් කසිප්පු පිරිලා වතුවල. එම නිසා මේකට අතිගරු ජනාධිපතිතුමාටත් මම කියනවා අගමැතිතුමාටත් මම කියනවා ඔයගොල්ලෝ ටැක්ස් දාපු එක හරි. ගැක්ස් ගහපුවාට පස්සේ ඒ මිනිහා කෙලින්ම කසිප්පු වලට තමයි යන්නේ. කසිප්පු මුදලාලිලාගෙන් පිරිලා දැන්. ඒ විතරක් නෙමෙයි දැන් ටැක්ස් ගැහුවා ඔක්කෝටම . ටැක්ස් ගැහුවාට පස්සේ වතුවල ඉන්න සේවකයන්ටත් ඒ ටැක්ස් ටික වදිනවා. මේ මිනිහාට රු.50/- පඩිය වැඩි කරලා ආවේ. ඒත් එක්කම ගරු සභාපතිතුමනි යටියන්තොට නගරයේ දැන් පාරවල් ටික කඩලා දාලා අවුරුදු දෙකක් විතර වෙනවා. මම හිතන විදිහට අපේ මහ ඇමතිතුමා මම දන්නේ නෑ හරියට මම හිතන විදිහට සල්ලි වගයක් පාස් වෙලා අර බෝක්කු ටික හදන කොට වැලි දාලා හදන කොට එක පාරටම නවත්තලා දැම්මා. මම අහන කොට කිව්වා ආර්ඩීඒ එකෙන් නැවැත්තුවා කියලා. එක්කෝ ආර්ඩීඒ එකෙන් කරලා දෙන්න ඕනේ. එහෙම නැත්නම් කරන මිනිහාට කරන්න දෙන්න ඕනේ. ඒක එහෙම්මම නවත්තලා කොන්ත්‍රාත් ගත්ත මිනිහාත් පව්. ගල් ටිකයි වැලි ටිකයි මහ පාරේ. ඒ නිසා ගරු සභාපතිතුමනි මේවාට පිළිතුරක් දෙන්න කියලා ඉල්ලමින්. දැන් හෙට අනිද්දා අයවැය තියෙනවා. අයවැයේදී මම ඔබතුමන්ලාගෙන් ඉල්ලා සිටින්නේ වත්තේ වැඩ කරපු ඒ කියන්නේ අපේ ඕ ලෙවල් කරපු ළමයි ඉන්නවා. තරුණ තරුණියෝ ඉන්නවා. ඒ ලෙවල් කරපු ළමයි ඉන්නවා. මම මේ සභාවට ඉල්ලා සිටින්නේ අපිට එපා මැනේජර්ලා එපා. අපිට එපා ලිපිකරුවෝ එපා. අපිට දෙන කොට අපිට එපා ඇටෙන්ඩන්ස්ලා එපා. අපිට එපා නර්ස්ලා එපා. මොකද නර්ස්ලා යන කොට අපිට සයන්ස් වලින් කරලා තියෙන්න ඕනේ. කෑගල්ල දිස්ත්‍රික්කයේ එකම දෙමළ ඉස්කෝලයක්වත් නෑ, මැක්ස් හා සයන්ස් තියෙන එකම ඉස්කෝලයක්වත් නෑ. නර්ස්ලා යන්න බෑ, පළාත් සභාවේ ගන්න කොට ඉස්පිරිතාලයට ගන්න කොට ඇටෙන්ඩන්ස්ලා අඩුම තරමේ ගන්න කොට වතුවල ඉන්න අයට දෙන්න එහෙම නැත්නම් ගරු සභාපතිතුමනි ඒගොල්ලෝ කොළඹ ගිහිල්ලා බංගලාවල වැඩ කරලා තරුණ තරුණියෝ කොළඹ ගිහිල්ලා කොත්තු රොටී ගහගෙන ඉන්නේ කරුණාකරලා ඇටෙන්ඩන්ස්ලා දෙන්න. මුර ජොබ් එකක් දෙන කොට දෙන්න. කාර්යාල සහායක දෙන කොට වතුවල ඉන්න තරුණ තරුණියන්ට බලලා දෙන්න කියලා ඉල්ලමින් 2017 අයවැයේදී මේවා සඳහන් කර ගන්න කියලා ඉල්ලමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*

---

බොහොම ස්තූතියි බාස්කරන් මන්ත්‍රීතුමනි. ඔබතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා සියල්ලම සම්බන්ධයෙන් අදාල බලධාරීන් දැනුවත් කරමින් ඉදිරි කටයුතු කඩිනමින් කරදීමට මැදිහත් වෙන බව ප්‍රකාශ කරනවා. දැන් වේලාව මධ්‍යහන 12.18 යි. අද දිනට මෙම සභාවේ වැඩ කටයුතු අවසන් කරනවා. මෙම ගරු සභාව 2016 ක්වූ නොවැම්බර් මස 28 වෙනි දින පෙරවරු 10.00 දක්වා කල් තබනවා.